
T E C K Y T H A N O M Y A
sinhalaebooks.com
මා ර යා ගෙන් ආදරය හොයන් ජීවත් වෙන්න පොර බදින ඇය
තාවී
♥♥♥♥♥♥♥♥♥

★AUTHOR★ APPROVED APPROVED

මෙම කෘතිය කතුවරයාගේ අවසරය සහිතව
**sinhalaebooks.com** වෙබ් අඩවියේ පළවන
නීත්‍යානුකූල පී.ඩී.එෆ් ගොනුවකි.

# හාවී

## 1 කොටස

"සුදු කොහෙද ඉන්නේ"

"අයියා මන් මේ එනගමන්..කලර් ලයිට් එක ලග"

"ආ හරි පරිස්සමට එනවා.. අම්මි බය වෙලා මෙතන පරක්කු වෙලා ගගා"

"ඉමාව ගෙදරට දන්න ගියානේ අයියා ඒකෙන් පරක්කු උනා අප්පා"

"හරි හරි තමුසේ නාවත් කමක් නෑ මගේ කාර් එක පරිස්සමට අරන් එනවකෝ මට බය ඒකමයි"

"තමුසේ නම් මහ හොඳ නෑ.. ඉන්නවකෝ මන් අම්මිට කියනවා"

"හා හා තියපම් මගේ සල්ලි මේ කැපෙන්නේ"

"කුනා"

මම හාවි.. හාවි සරන්‍යා.. වයස අවුරුදු 24යි. ඔය කෝල් කරේ නම් මගේ වන් ඇන්ඩ් ඔන්ලි අයියා අපි දෙන්නා ඉතින් ඉපදුන ද ඉදන් වලිම තමා එයා නමින් හානුක සස්මිත. මට වඩා අවුරුදු 5ක් වැඩිමල්.. වයස හදගන්නකො ඉතින්

අපේ ගෙදර ඉන්නේ අම්මි අප්පච්චි මම අයියා.. අප්පච්චි හිටපු පොලිස් S.S.P කෙනෙක්.. දැන් පෙන්ශන් ගිහින් මාස දෙකක් විතර ඇති... දැන් අපේ පරම්පරාවෙන් හම්බුන ගාමන්ට් ෆැක්ට්‍රි එකක්

කරගෙන යනවා.. අම්මි නම් කෝමත් ගෙදර නේ එතකොට අයියා එයා තමයි අපේ කම්පැනියේ අප්පච්චි එක්ක ඉඳගෙන වැඩ බලන්නේ.. එතකොට මේ මම ජොබ් එකකුත් නොකර ඔහේ ගෙදරට වෙලා යාලුවෝ එක්ක රවුම් ගහ ගහ ඉන්නව කියල තමයි අපේ අම්මි නම් කියන්නේ..

අදත් ඔන්න අපි සෙට් එක චුට් රස්තිවාදුවක් දලා ගෙදර යන ගමන්.. චුට්ටක් රෑ උනා අද. ඉමා, ඒ කියන්නේ මගේ බෙස්ට්ලා අතරින් බෙස්ට් ම බෙස්ට් නමින් ඉමංසි ආරාධ්‍යා. අම්මා අප්පච්චි දෙන්නම ගුරුවරු උනු පවුලක වැඩිමලා.. නංගිලා දෙන්නෙක් ඉන්නෝ තව ඉමාට.. අනිත් සැට් එකේ නම් කියන්න ගියොත් ඔන්න පිළිවෙලින් අයුමි, ඔලිනි,තියුරි, හසාලි, කාවින්දි අපේ සෙට් එකේ කෙම්ලොම හතයි.

ඉමාවත් දලා කලර් ලයිට් එකත් පහු කරලා දෙවෙනියට හම්බෙන පාරෙන් වමට දලා චුට්ටක් දුර ගියාම තමා අපේ ගෙදර.. ඉතින් සුපුරුදු විදියටම කලර් ලයිට් එකත් පහු කරන් ඇවිත් අපේ පාරට දද්දිම වගේ කොහෙද්‍යෝ ඉදන් ආපු කාර් එකක් වදින්න ඔන්න මෙන්න තියලා බ්‍රේක් ගැහුවේ මගේ ඇග හීතල වෙලා යද්දි.. ඇයි දෙයියනේ අයියගේ කාර් එක. රස්තියාදු වේ යන්නමයි අඩල අඩල ඉල්ල ගත්තේ වැදුනා නම් එහෙම ආයේ ඉන්න හම්බෙන් නෑ.. එකසිය ගානට මල පැනල කාර් එකෙන් බැස්සේ.. තදියම හැදිලා වාහන එලවන්නේ මොකාටද බලන්නයි.. මන් බැස්සට මොකද එලවන් ආපු මනුස්සයා නම් බහින පාටක් නෑ.. මූණත් රතු කරගෙන ඒ කාර් එක ලගටම අඩි තිබ්බේ කේන්තියෙන්

"ඒ හලෝව්.. ඕක අයින් කරගන්න අදහසක් නැද්ද මට යන්න"

තවත් තත්පර ගානකින් පස්සේ ඒ කාර් එකේ ඉදිරිපස දෙර ඇරුනේ මාව චුට්ටක් බය ගන්වමින් කිවොත් හරි.. මොනා උනත් කොච්චර කියෙව්වත් බයයිනේ ඉතින්.

හැඩිදැඩි සිරුරක්.. මන් දැක්කේ එපමණයි.. මන් ලගට අඩි තියෙනවත් එක්කම පිටිපස්සෙන් ආපු කවුරු හරි සැර ගඳක් එන ලේන්සුවක් නහයට කරේ.. එතැන් සිට වූ සියල්ල බොඳව යද්දි..

ඔලුව පැලෙන්න තරම් රිදෙද්දි... ඇලිල වගේ තිබුනු ඇස් පියන් අපහසුවෙන් ඇරලා බැලුවේ ඉන්නේ කොහෙද බලන්නයි.. ඒක සුඛෝපභෝගී කාමරයක්.. අත් බැදලවත් කට බැදලවත් මොකුත් කරල නැ.. ඇඳක නිදිකරවලා.. ඇදන් උන්නු ඇදුම දන් උන්නු ජුවෙලරිස් වලට වත් මොකුත්ම වෙලා නැ.. කාමරේත් කවුරුවකුත් නැ.. උනේ මොකක්ද කියල දහ අතේ කල්පනා කරද්දි මතක් උනේ මන් කාර් එක ලගට ඇවිදන් යනවයි.. කෙනෙක් බහිනවයි විතරයි.. අත බැඳි ඔරලෝසුවෙන් වෙලාව බැලුවම පාන්දර 3.45 යි.. ඒ කියන්නේ රෑ ඉදන් මන් මෙතනද.. දෙයියනේ අම්මි අප්පච්චි අයියා.. එයාලා බය වෙලා ඇති... ඔලුවත් දෝතින්ම බදගෙන ඇදෙන් බිමට අඩි තිබ්බේ ඉන්නේ කොහෙද කියල බලන්නයි..

එතකොටම වගේ දොර ත් ඇරගෙන ඇතුලට ආවේ .. කලින් දැකපු රූවයි.. ඒත් මූණ වැහෙන්න කලු මාස්ක් එකක් දලා.. ඇස් විතරයි..ඒ ඇස් හරි අමුතුයි.. බලන්න බයයි.. ඒත් අමුතු ලස්සනක් තියෙනවා.. එවෙලේ දැක්කෙත් හැඩි දැඩි සිරුර විතරයි.. ඒ දැකපු කෙනාමයි මේ කියල අදුරගන්න වැඩි වෙලාවක් ගියේ නැ.. අඩියක් පිටුපසට උනත්, දොරෙන් අඩිතියල හෙමිහිට ලන් වෙද්දි ගැහි ගැහිම උනත් වචන පැටලුවේ

"ඔ..යා..ක..වුද.."

නැ පිළිතුරක්..

"මන්.. මේ.. කොහෙද...ඉන්නේ"

නෑ කිසි පිලිතුරක්..

අඩියට දෙකට ඇවිත් බෙල්ල පිටුපසින් තද කරලා අතැති වූ ලේන්සුවක් නහයට ලං කරේ.. ඒයේ නහයට දැනුනට වඩා මදක් අඩු සැරක් නාස් පුඩු ගලවන් යන තරමට දැනෙද්දි.. ඇස් වලින් කඳුලු වැක්කෙරෙද්දි.. කැස්සක් ආවේත් ඒ සැරටයි.. ලේන්සුව ඉවත් කරන්න අත් වලින් වෑයමක් දැරුවත් ඇගම පණ නැති සේයාවක් දැනේ.. සියල්ලු බොඳවී කලුවර වීමට ගියේ විනාඩි කිහිපයක් පමණයි..

ආයෙමත් සැරයක්.. අපහසුවෙන් දෑස් පියන් විවර කරලා සෑහෙන වෙලාවකට පස්සේ ඇස් ඇරියත් සියල්ල පණ නැතිව ගියාක් මෙනි.. ඇගට කිසිම පණක් නෑ.. උඩ කැරකෙන සීලිත් ෆෑන් එකෙත් ඇස් අහකට ගෙන අපහසුවෙන් බෙල්ල හරවල බලද්දි.. ඔව් අර රුව ඇද කිට්ටුව තිබූ පුටුවක වාඩි වෙලා ඒ දෙඇස් මගේ පැත්තේ.. ආයෙත් සැරයක් ආයෙත් සැරයක් ඒ දේට මුහුණ දෙන්න වේදෝ දැනුනු බියෙන්.. ඇස් තදින් පියා ගත්තේ බයටම කඳුලු වැක්කෙරෙද්දි..

දෑස් පියාගෙන හිටියා උනත් පුටුවෙන් නැගිටින හඬ ඇහෙද්දි.. ඉකි ගැහෙන්න පටන් ගත්තේ මටත් නොදැනිමයි.. තත්ත්පර ගානකින් දෙඋරහිසෙන් අල්ලලා පරිස්සමට දැනෙන නොදැනෙන ගානට ඇද පත්තෙත් හාන්සි කෙරේව්වේ පිට පෙදෙසට කොට්ටයක්ද තබමින්.. බයයි ඇස් අරින්න.. බයයි ආයෙමත්.. බයයි මොනා වෙයිද කියන්න.. බයයි කතා කරන්න.. බයයි කෑ ගහන්න.. දෙයියනේ මට මොකද මේ උනේ.. කඳුලු කැට ඔහේ කඩන් වැටෙද්දි.. දෙතොල් සපාගෙනම ඉකිය තද කරන් උන්නෙත් බයටමයි.

රළු ඇගිල්ලක පහසකින් දෙඇස් වලින් වැටෙන කඳුලු පාර පිස දැමෙද්දි.. ලාවට ඇස් ඇරල බැලුවේ මටත් නොදැනිමයි.. කියා ගන්න බැරු තරම් වේගෙකින් පපුව රිද්මෙට ගැහෙද්දි.. ඒ ගැහෙන වේගේ මටම දැනෙන තරමටම මන් බය වෙලා.. නමුත් ඔහු නිහඬයි.. තවමත් ඇස් විතරයි පෙනෙන්නේ.. තත්පර ගානක් ඒ ඇස් දිහා බලන්

ඉදලා ක්ශනයෙන් ඉවත බලාගත්තේ ඔහුත් අසලින් ඉවත් වෙද්දි..

තවත් මිනිත්තු දෙකකින් පමණ දෙරට තට්ටු වූවායින් අනිත් පසෙකි න් ලැබුනු ට්‍රේ එකක දමා පිලිගන්වපු කෑම ප්ලේට් එකක් ඔහු අතට අරගෙන නැවතත් දෙර අගුලු දැම්මේ හෙම්හිට මදෙසට අඩි තියද්දි. පැය ගනනකින් කුසට අහරයක් නොමැති නිසාම කෑම එකෙන් ආපු සුවඳත් එක්කම කටට කෙල නොඉනුවා කිවොත් බොරු.. ඊටත් වඩා වතුර ටිකක් වත් නැතුව තොල කට වේලිලා තිබුනේ..

ඇදේ පසෙකින් හිඳ ගනිමින් ට්‍රේ එක පැත්තකින් තියල තිබුනු ෆ්‍රයිඩ් රයිස් ප්ලේට් එකයි ගෑරුප්පුවයි අතට ගනිමින් කට කට ගෙන හෙම්හිට මුවඟට ලන් කරේ කුසගිනි නිසාම මමත් කද්දි.. කටවල් දෙකයි.. පපුව හිරවේගන ගියේ ඇසිල්ලකින් මගේ එක අතක් පපුව තද කරගනිද්දි..දෑස් පියාගෙනම පපුව අතගෑවේ ගෑරුප්පුව ප්ලේට් එක එකට වදින කලබල සද්දයක් ඇහෙද්දි.. ඔහුත් කලබල වූ සේයි. වතුර වීදුරුවක් තොලට ලන් කරේ හිස් දෙපසට වනලා මන් වතුර ප්‍රතික්ෂේප කරද්දි..

විසිරිලා අවුල් වෙල තිබුනු හිසකෙස් අතරින් රලු දෑගිලි වගයක් කෙස් අතරින් දැනෙද්දි හිස අතගෑවෙද්දි

"ශ්...චුට්ටක් බොන්න.. හරියන්න ඔක.."

නොනිවුනු අමුතු කටහඬකින් එහෙම කියල නැවතත් වතුර වීදුරුව තොලගට ලන් කරේ යන්තම් කට තෙමෙන්න වතුර උගුරක් මන් පානය කරද්දි.. කිවත් වගේම තවත් තත්පර ගානකින් හිර වුනු එක හරි ගියා.. එක පාර බඩගින්නේ ඉදල ඉදලා කන්න ගිය හින්ද වෙන්න ඇති.. ටික වෙලාවක් ඉදල ආයෙමත් සැරයක් කවන්න පටන් ගත්තේ මිනිත්තු 15 කින් විතර ඒ ප්ලේට් එකම කාල ඉවර කරද්දි.. වතුරත් දීලා ආයෙමත් ඒක දෙරෙන් එලියට දීලා .. මට කාමරය තුලම වූ වොශ් රූම් එක පෙන්නුවේ.. කෑමෙන් ආපු පණත් එක්ක මන්

හෙම්හිට අඩි තියල ගිහින් ඒ අවශ්‍යතාවය කරගනිද්දි.. නැවතත් ඇද දෙසට අඩි තිබ්බත්.. අනිත් පසින් ඔහු ලගට ආවේ ලේන්සුවක් අතැතිවයි..

"අනේ.. එපා.." කියල කෑ ගැහෙන්න මත්තෙන් කලින් වූවාක් සේම නාස් පුඩු කඩන් යන්න තරම් සැරක් දැනෙද්දි.. තත්පර ගානකින් කැස්සත් එක්කම මෙච්චර වෙලා අමාරුවෙන් කාපු ඔක්කොම ටික වමනේ උනේ.. ඇස් වලින් කන් වලින් නහයෙන් කටින් මුලු සර්වාංගයෙන්ම දුම් පිටවනවාක් සේ දැනෙද්දි.. පෙරටත් වඩා කලබලයි ඔහු.. ඔව් කාපු ඔක්කොම ඔහුගේත් මගේත් ඇඳුම් මත ..මටත් වඩා ඔහුගේ ඇඳුම් මත.. ආයෙත් සැරයක් ශරීරය අඩපණව බිමට ඇද වැටෙන්න ගියත් වැටෙන්න නොදී ඒ කයට වාරු කර ගත්තේ යම් කලබලේකින් බව පැහැදිලී.. දුටුවේ එච්චරයි.. සියල්ල බොඳ වී අඳුරුව ගියේ සැනෙකින්..

පෙරට වඩා ඉක්මනට ඇස් ඇරගන්න පුළුවන් උනත් ඇදන් උන්නුඇදුම් සියල්ල ඉවත්ව හවුස් කෝට් එකක් බඳු ඇදුමක් අන්දවලා තියෙද්දි දෙඇස් වලට ආයෙම කඳුලු ඉනුවේ ඉකියෙන් ම මන් ඇඳ විට්ටමට හේත්තු වෙද්දි.. තත්පර කිහිපයකින් වොශ් රූම් එකෙ දොරත් ඇරගෙනම ඉවතට ආවේ ඔහුයි.. කලින් ඇදන් උන් ඩෙනිම ජැකට් එක මාස්ක් එක ඒ කිසිවක් නෑ.. සැහැල්ලු ශොට් එකක් එක්ක..ටවල් එකකින් ඔලුව පිහිද පිහිද ඉවතට ආවේ.. මා සිටින බවක් අමතක වූවා නම් විය නොහැක.. සමහර විට මම මෙච්චර කලින් අවදි වේ යැයි නොසිතූ නිසා විය හැක..

ඔලුව පිහිදල ඉවර වෙලායි ඇද දෙස බැලුවේ.. තරමක් අපහසුවෙන් ඒ වත ගැස්සුනත් එය නොපෙන්වා ඇද දෙසට ආවේ පුටුවත් ඇද ලගට ඇදගනිමින්..

"ඇඳුම් මාරු කරේ ඒවා ඇදන් ඉන්න බැරි හින්ද.. එතනින් එහාට කිසි දෙයක් උනේ නෑ.. "

ඊට එහාඑක වචනයක් වත් පිට වෙන් නෑ ඒ මුවින්.. බැරිම තැන..

"අනේ මට.. ඇයි මෙහෙම කරන්නේ.. " දෑත් එක් උනේ කඳුලුත් එක්කම ඉකියකින් ඒ වචන පෙල පිට කරද්දි.

"අනේ මාව.. ගෙදර එක්කන් යන්න.. ප්ලීස්.. මන් ඉන්නේ කොහෙද කියන්න "

"මට ගෙදර යන්න ඕනි ප්ලීස්.."

දහක් දේ කිව්වත් නෑ පිලිතුරක්...

"අනේ මගේ අම්මා අප්පච්චි අයියා.. මන් එනකම්.." ඉතුරු ටික කියන්න හම්බුනේ නෑ.. ඒ වෙනුවට කන් අඩි පුපුරන තරම් හයියෙන් ඔහු කෑ ගැහුවේ..." නවත්තපන්" යනුවෙන්..

බයටම කියවිල්ල නතර කර ගත්තේ කිසිත් නොකියායි..

ඒත් ඔහු නිවුනු පාටක් පේන්න නම් නෑ.. මගේ කට දෙපසින් තද කරලා ඇදෙන් නැගිට්ටෙව්වේ.. කඳුලු පනින තරමට රිදෙන්නම කට දෙපස මිරිකගෙන

"මෙහෙට ගෙනාවේ.. උඹව ගෙදර යවන්න නෙමේ.. ගෙනාවේ මරලා දාන්න. මරලා දාන්න යකෝ.. හුරතල් කරන්න නෙමේ.."කන් දෙගුරුම් දෙන තරමට ඔහුගේ හඬ ප්‍රබල වෙද්දි..

අපහසුවෙන් ඉකෙන් වගේම වෙව්ලන ස්වරයෙන්

"එක..පාර.. මරලා දාන්න එපා..."

"මෙහෙට වර බැ#&$*#@ " ඒ කිව වචනෙට හිතා ගත නොහැකි තරමට ඒ ඇස් රතු වෙලා මස් පිඩුඉලිප්පිලා දලා තිබුනු පෝනි ටේල් එකෙන් ඇදගෙන ඇවිත් බිත්තියට හේත්තු කරද්දි.. ඒ වේගෙට ඔලුව පිටුපස බිත්තියේ ඇනුනේ ලේ එන බව මට දැනෙද්දි.. එය කිසිත් ගනනකට නොගෙන ඒ තිබුනු ආවේගෙන්ම බිත්තියට තද කරගෙන අසල තිබුනු කෙටි කොට්ටයක් එක අතකට ගෙන හුස්ම පොදක් ගැනීමට නොහැකි තරම් වූ තදේට නහය කට වැහෙන විදියට තද කරේ දියෙන් ගොඩට දපු මාලුවෙක් නැත්නම් වතුර භාජනේක ඔබපු මනුස්සයෙක් ජීවත් වෙන්න හුස්ම හොයන වැයම මන් ඒ තත්පර කීපයට අත් විදිද්දි.. කන් විවර වලින් දුම් පිටවෙද්දි කකුල් අත පය ගස ගස ඉවත් වෙන්න වෙර දරද්දි.. එක් අතක දෑගිලි වල වූ නියපොතු වලින් අර පිරුණු කය සීරෙද්දි.. අනෙත් අතෙහි නියපොතු වලින් අසල තිබූ බිත්තිය කොනිති ගැහෙද්දි.. මල කඳක් සේ ඇදට වැටුනත් කොට්ටය ගිලිහෙද්දි ලැබුනු ඒ සුසුම් පොදෙන් තවමත් ජීවතුන් අතර බව පසක් උනු නමුත් සියල්ල අඳුරු විය.

## 2 කොටස

පැය කීපයක් ඒ විදියට වැතිර සිටිද්දි ඇස් ඇරලා බලද්දි

"මගේ රත්තරන්.. අනේ දේණි.. මොකද උනේ වස්තුව..දෙයියනේ මගේ පණ ටික.. අනේ මොකක්ද මැතික මේ උනේ.."

අම්මිගේ හඬ ඇහුනත් දකින්නේ සිහිනයක් ද කියල හිතා ගන්න බැරුව තවත් තත්පර ගානක් උන්නා.. සිහිනයක් නෙමේ කියල ටික වෙලාවකින් තේරුනේ අප්පච්චි වගේම අයියත් රෝහල් ඇඳ වටේට ලන් වෙද්දි.. ඔව් මම ඇහැරෙද්දි උන්නේ හොස්පිටිල් එකක. මන් දන් නැ මේ දේවල් කොහොම උනාද කියන්න.. ඒත් හිතට සැනසීමයි. අම්මි

අප්පච්චි අයියා ලග ඉද්දි. ඔලුවයි එක අතකුයි බැන්ඩේජ් කරල..තාමත් මුලු ඇගෙන්ම දුම් පිටවෙනවා වගෙයි. ඩොක්ටර්ස්ලාත් ඇවිත් මොනවද්දෝ චෙක් කරලා.. ගෙදර යන්න පුළුවන් කිව්වයින් තවත් පැය එකාමාරකින් විතර අපි ගෙදර ආවා.. අඩිය තියන්න බැරිතරමට මන් දුර්වල වෙලා හිටපු හින්දු අප්පච්චිම ඇවිත් උඩ රූම් එකෙ මගේ ඇඳෙන් මාව තියල දෙර වහල ගියා.. දන් නැ මන් එයාලා මාව කොහොම හොයා ගත්තද කියන්න. ටික වෙලාවකින් අම්මි ආවේ සූප් එකක්ද අතේ රැගෙනයි.. ඒ ඇස් වලත් කඳුලු..

"උන් උඹට ගොඩක් රිද්දලා මයේ පුතේ"

"ක...වු...ද.. අම්...මි.. ඒ"

"මොක්කුද මැරයෝ වගයක් මයේ රත්තරන්.. අප්පච්චි ගෙන් කප්පම් ගන්න.. "

හිත පිලිගත් නැ ඒ දේ.. හිත කියන්නෙම වෙන මොකක් හරි දෙයක් හින්දු කියල.. කිසිත් නොකියා ලාවට හිනා උනේ.. සූප් එක අම්මා අතින්ම පොවද්දි..

දවස් දෙකකින් විතර මන් රිකවර් උනේ.. ඒ පිලිබඳ කිසි කතාවක් අපේ ගෙදර නොවෙද්දි.. ඒත් තුන් වෙනි දවසේ උදේ.. මන් උන්නේ අම්මි එක්ක කිචන් එකට වෙලා උදේ කෑම හද හද.. උනු දේවල් සියල්ල අමතක කරන්න ඕනි වෙලා තිබ්බත්.. එක පාරටම...

"ද්‍රෝණී පුතේ.."

"අප්පච්චි.."

"උදේට කෑම කාලා පොලිසියට යන්න ලෑස්ති වෙන්න.. කට උත්තරයක් ගන්නයි හඳුනා ගැනීමේ පෙරෙට්ටුවකටයි එක්කන් එන්න

කිව්වා ද්‍රෝණිව.. බය වෙන්න දෙයක් නෑ මැනික.. අප්පච්චි අයියයි ඉන්නවනේ"

"හා අප්පච්චි"

කෑම කාලා එහෙම සැහැල්ලු ගවුමක් ඇඟලා ගත්තේ ඩෙනිම් කොට ගහගෙන පොලිසියට යන්න හිත නොදුන්න නිසයි. බැන්ඩේජ් තාමත් එහෙම්මමයි.. සිනිඳුවට ලස්සනට සුදුවට තිබුනු වමතේ ඇඟිලි වල නියපොතු කැඩිලා ගැලවිලා ලේ ඇවිත් තුවාල වෙලා කැත වෙලා තිබුනේ.. තුවාල නම් තරමක් හොඳ උනත්.. තාමත් ඇදුම් කනවා සමහර වෙලාවට.. පෝනිටේල් එක ද ගන්නවත් ඇඟිලි වාරු නොවෙද්දි.. කොන්ඩේ කඩල දලා දෙපැත්තෙන් චූට්ටක් අල්ලලා කට්ටක් ගහගෙන චිත් කාර් එකට ගොඩ උනේ දහක් දේ කල්පනා වෙද්දියි.. වීදුරුවෙන් ඉවත බලාගෙන ටවුමේ තිබුනු පොලිසියට ආවේ අප්පච්චිගෙත් අයියගෙත් පිටිපස්සෙන් මත් පොලිසිය තුලට අඩි තියද්දි...

"ගුඩ් මෝනින් සර්.."

"මෝනින්.. මෝනින්.."

අප්පච්චිත් මේ පොලිසියෙම උන්නු S.S.P හින්ද ඉන්න සේරවන්වම අඳුරනවා.. ලා හිනාවක් දලා ඇතුලට උනේ.. අප්පච්චි පෙන්නපු අසුනකින් ඉඳගනිද්දි අප්පච්චියි අයියයි ගියේ මට ටිකක් ඉස්සරහින් තිබ්බ ටේබල් එකක් ලගට..

"ගුඩ්මෝනින් අන්කල්.. කලින්ම ඇවිත් නේ.."

"ගුඩ්මෝනින් පුතා.. දැන් පෙන්ශන් නේ කලින් එන එක හොදයි හිතුනා.."

"ගුඩ්මෝනිත් හානුකයා.."

"ගුඩ් මෝනිත් මචෝ"

සුලු කතාබහක් ඈතින් ඇහෙද්දි කටහඬේ හුරුවට ඔලුව උස්සලා බැලුවයින් ආයෙත් සැරයක් මුලු ගතම පණ නැති උනේ ඒ කවුද කියල අඳුරගත්තයින් පස්සෙයි.. ඔව් දවස් දෙකක් පුරාවට මන් හිටියේ ඔහු ලගයි..

S.S.P. ධීර් ඉශාක්‍ය මදුරප්පෙරුම

ඔව් එයා ඉදන් උන්නු ටේබල් එකේ ගහල තිබ්බේ එහෙමයි. දුර තියාම මා දෙස බලන බැල්මත් සාමාන්‍ය යි. කිසිත් හිතා ගන්න බැරුව ගොලු උනේ අප්පච්චි ගේ හඬට පියව් සිහියට එද්දි.

"දේණි.. එන්න්න පුතේ.."

කිසිත් නොකියමම අප්පච්චි පස්සෙන් වැටුනේ කවුදෝ මන්ද මිනිස්සු කීප දෙනෙක් එතනට වට වෙලා..

"දේණි බලන්න මැනික.. එදා මේ අයගෙන් කාව හරි ඔයා දැක්කද කියල.. හොදට මතක් කරලා.."

කොහොම කියන්න ද දැක්කේ කාවද කියල..පැත්තක ඉදන් මා දෙසම බලන් ඉන්න ඒ ඇස් මගඇරලා අප්පච්චි දිහා බලලා හිස දෙපසට වැනුවේ කවුරුත් නෑ කියන්නයි.

"දේණි ටිකක් හොදට බලන්න පුතේ.. බය වෙන්න ඕනි නෑ කිසිම දේකට.. මේ ධීර් අයියා මගේ ගෝලයෙක්.. "

අප්පච්චි කියන වචනයක් වචනයක් ගානේ මගේ හිත මගෙන්ම ප්‍රශ්න

කරද්දි ආයෙත් සැරයක් ඒ ඇස් මගෑරලා නෑ කියල අප්පච්චි ට ඔලුව වැනුවේ.. අප්පච්චි ඔලුව අතගාලා ලගට කරගනිද්දි..

"මෙයාලට යන්න කියන්න ඩීර්.."

අප්පච්චි එහෙම කියල තවත් සුලු කතාබහකින් අනතුරුව මාව ඒ ටේබල් එක ඉස්සරහ තිබ්බ අසුනේම ඉන්දවලා අප්පච්චි අයියත් එක්ක පොලිසියේ අඳුරන තවත් දෙතුන් දෙනෙක් එක්ක කතා බහකට වැටුනේ.. අර ඇසුත් මගේ ඉස්සරහම වෙද්දි.. කිසිත් කතාවක් නෑ.. බලන් ඉන්නව විතරයි.. කියන්න තේරෙන් නෑ මේකේ තේරුමක්.. ඇයි එහෙම කරේ කියන්න.. බැන්ඩේජ් කරලා තිබ්බ ඔලුවයි අතයි දිහාත් තරමක අමුතු බැල්මක් දාලා ටේබල් එක ලගම වූ කබඩ් එකක ලාච්චුවක් ඇරලා මොනවදෝ එලියට ගත්තේ මාත් බලද්දි..

"ඔයාගේ ෆෝන් එක බෑග් එක කාර් එකේ කී එක..මොනා හරි අඩුයිද කියල බලන්න.."

මොනා කියන්න ද කියල හිතා ගන්න බැරි තැන බඩු ටික අතට ගත්තේ ෆෝන් එක අන්ලොක් කරලා මන් බලන්න ගනිද්දි.. කෝල්ස් තියෙනවා ඒ ටිකට හැට හුටාමාරක්.. යාලුවන්ගෙන් මැසේජස් පවා.. ටිකකින් අතේ තියෙද්දිම සේව් කරල නැති නම්බර් එකකින් කෝල් එකක් ආවේ මන් සයිලන්ට් කරද්දි. තත්ත්පර කීපයකින්

"දැන් කෝල් එක ආපු නම්බර් එක මගේ. සේව් කරලා තියාගන්න"

ප්‍රශ්න කන්දක් ඔලුවේ තියාගෙන කලබලේටම ඒ නම්බර් එක SSP කියල සේව් කරගත්තේ කිසිත් නොකියායි.

සති දෙක තුනක් සාමාන්‍ය විදියට ගෙවුනේ ගෙදර තුලමයි. උන දේ හැටියට වෙනදා වගේ එලියට යන්න මන් බය උනා. දවසක් උදේක.

"දේශණී..."

"අම්මි.."

"අප්පච්චි කෝල් කරා"

"ඇයි අම්මි.."

"කවුද්දෝ යාලුවෝ වගයක් එනවලු දේශණීව බලන්න ඉක්මනට ලෑස්ති වෙන්නෙයි කියන්නේ"

"අනේ මොකක්ද අම්මි.. මට බෑ අප්පා එපා වෙනවනේ.."

"කෑ ගහන්න දෙයක්ද ලමයෝ ඕක.. බලන්න එන පලවෙනි මනුස්සයා නෙමේනේ.. හොයන හොයන එක අකමැතීනේ.. මේකටත් කැමති නම් කැමති.. නැත්නම් අප්පච්චි ට කියන්න කැමති නෑ කියල..බොරුවට යටි ගිරියෙන් බෙරිහන් දීලා මගෙන් පාරක් නොකා ගිහින් ඇඳුමක් දන් ලෑස්ති වෙන්නයි කිව්වේ"

අම්මි එක්ක කතා කරල බේරෙන්න බැරි තැන එයාටත් රවාගෙනම මන් ගියේ අයියව හොයන්.. කාමරේ මොකක්දෝ වැඩක්..

"මොකෝ සුදූ මේ බෙරිහන් දෙන්නේ.."

"අනේ මේ අයියා තමුසෙටත් මගෙ බෙරිහම විතරයි පේන්නේ.. මේ කරදරෙන් මාව බේරගන්නවකෝ ඕයි.. ඔය එන එකෙක්වත් මට හරියන් නෑ.. එක්කෝ එන එකා එන්නේ අපේ සල්ලි වලට නැත්නම් මගේ ලුක් එකට.. එක්කෝ එන එකා මහ පුරාජේරුවෙක්.. ශික් මට පෙන්නන්න බෑ නේ ඔය කාවවත්..මොකක්ද අයියා මොනා හරිකරල බේරනවකෝ මාව.."

sinhalaebooks.com

"මොනා බේරන්නද බන්.. ඔන්න ඔහේ වෙනදා වගේම අයුබොවන් කියල අම්මි අල්ලන ට්‍රේ එකෙන් මොනා හරි කාලා උන්ටත් එපා වෙන්න හැසිරියන්.. එතකොට උන් යයි"

"හැමදම ඕක කරන්න බෑ නේ ඕයි. ටිකක් තේරුම් ගන්නවකෝ.. කොයි වෙලේ හරි අප්පච්චි මගේ දත් සෙට් එක බඩට අරිනවා.. එන එන් එකාට අකමැති වෙලා"

"එහෙනම් ඔය අද එන එකාට කැමති වෙයන්.. වැඩේ ඉවරයිනේ"

"අනේ මේ. මේ ගෙදර ඔක්කොම එකයි. ඔක්කොම මාව කන්න තමා බලන් ඉන්නේ.."

අයියාටත් ගස්සගෙනම මන් කාමරේට වැදුනේ.. එන කරදරේට බේරෙන්න අඳින්න ඇඳුමක් හොයාගන්නයි.. ගවුම් තමා ඉතින් අම්මි අඳින්න කියන්නේ.. අලුතෙන් අයියා අරන් දුන්නු කහ පාට දිග...... ගවුමක් තිබ්බා කොහෙටවත් අඳින්න හම්බුන් නෑ.. ක්ෂනික ඒක මතක් වෙලා අල්මාරියෙන් අරගෙන කොනක ඉඳන් අයන් කරන්න ගත්තේ හැටට හැටේ.. කෝම හරි හවස 2.30 විතර වෙනකොට අර කට්ටියත් ආවා.. සුපුරුදු පරිදිම හෙප්පුවත් අරන් ඉස්සරහට ගියේ ආයේ ඉතින් දහ පහලොවකට ඕක දීලා දීලම මට ඇස් වහගෙන උනත් ගිහින් දුන්නැකි පුරුද්දට..

ඈත තියාම බිම බලාගෙනම ඇවිත් හෙප්පුව දීලා ඔලුව උස්සලා බැලුවේ කවුද කියල බලන්නයි.. කලබලේට මුලු ගතම ගැස්සිලා යද්දි..

3 කොටස

ඔව් ඒ ඔහුයි.. මන් මෙච්චර කාලෙකට වැඩිපුරම බය වුනු රුවයි.. හැමොම හිනා වෙනවා සද්දෙට.. හැමෝම හිනා වෙනවා සතුටින්

"ද්‍රේණිට මතකයි නේද අයියව.."

"අපි කිවේ භානුදේව.. මේ දෙන්නා නියමෙට මැච් කියල.."

කට්ටියගේ කසුකුසුව මැදෙන් හොල්මන් වෙලා වගේ උන්නු මන් අම්මි පෙන්නුව අසුනෙන් ඒ කියන්නේ එයාට එහා පැත්තෙන් වාඩි වුණා..

"එදා මෙයා එක පාර ගෙදර ඇවිත් මැරි කරන්න ඕනි කියල කිවේ.. පස්සේ කවුද කින්ද මන්ද කියල ඇහුවම තමයි කිවේ එදා දැක්ක පාර භානුදේව අංකල් ගේ දුව කියල විස්තර කිවේ ... පස්සේනේ ඉතින් අපිත් දන්නේ භානුදේව ට මෙච්චර ලස්සන ද්‍රේණියෙක් ඉන්නවා කියල"

"කොච්චර දෙයක්ද ධර්මදාස අදුරන තැනකින්ම කටයුත්තක් කරල දෙන්න ලැබෙන එක.. එතනින් එහාට බයක් නැ ද්‍රේණි ගැන.. පහුගිය ටිකේ උන දේවල් එක්ක, ද්‍රේණිට ඉන්න සේෆ්ම තැන තමා ධීර් පුතා ලග.."

දෙයියනේ අප්පච්චි ත් මොනවා කියෝනවද දෙයියනේ.. මන් මොනා කියන්න ද මේ දේවල් වලට. ඇයි මට එහෙම කරේ මේකෙනා.. හිත වෙනම ලෝකෙකට යද්දි සෑහෙන දිග කතා බහකින් පස්සේ

"ද්‍රේනි අයියා එක්ක මිදුලට ගිහින් කතා කරන්න.. දෙන්නට කතා කරන්න දේවලුත් ඇතිනේ"

අම්මිගේ ඒ වචන වලින් මගේ දෙලෝ රත් වෙද්දි හැමෝම වද කර කර කිව කමටම නැගිට්ටේ මිදුලට යන්නයි.. මගෙ පස්සෙන්ම ඔහුත් ඇවිදන් ආවා.. එලියෙ තිබුනු යකඩ පැද්දෙන ලොකු පුටුවේ කෙරවලෙන් මන් වාඩි උනේ ඉවත බලාගෙනමයි. ඔහුත් අනෙක් පසෙන් අසුන් ගත්තේ කිසිත් නොකියායි. බැරිම තැන,

"ඔයා ඇයි මට මෙහෙම කරන්නේ.. මන් මොකක්ද ඔයාට කරපු වැරැද්ද"

පිලිතුරක් නෑ

"දෙයියන්ගේ නාමෙට කතා කරන්න ප්ලිස්.. ඔයාට වැරදීමක් වෙන්න ඇති අනේ මන් කවදවත් ඔයාව දැකල වත් නෑ නේ මීට කලින්"

"තමුන්ගේ ගෙදර හින්ද කට සද්දෙයි නේද.."

"ආහ්"

"ඔය කට කඩන්න මට එච්චර වෙලාවක් යන් නෑ"

බය හිතෙන විදියට ගොරෝසු කටහඬකින් එහෙම කිවේ මගේ මුලු ඇඟම ආයෙම ගැහෙන්න ගනිද්දි

"ඇයි ඔයා මෙහෙම කරන්නේ කියන්නකෝ දෙයියනේහ්.. මන් දැන ගන්න එපැයි හේතුවක්.."

"මට කතා කරන්න දෙයක් නෑ.. උඹ මේ මැරේජ් එකට කැමති වෙන්න ඕනා."

"පිස්සුද දෙයියනේ. ඔයා වගේ කෙනෙක් එක්ක පවුල් කන්න. ඊට හොඳයි වහ ටිකක් කාල මැරෙනවා."

"මැරියත් ඒකම තමයි මටත් ඕනා.."

ඇස් වලට කඳුලු පිරුනේ දැනුනු අසරණකමටමයි.. අවුරුදු 24 ක් පුරාවටම සතුටින් ආදරෙන් උන්නු මට මොකක්ද දෙයියනේ මේ උනේ.. මුලු ජීවිතේම කනපිට හැරෙන්න එක තත්පරයයි මට ගියේ..

ඒ ක්ශනයෙන් ඉන පිටිපස්සෙන් අත දලා ලගට කර ගෙන ඒ විසල් පපුවට තුරුල් කරගත්තේ ඔලුව අත ගාන ගමන්.. එක පාර මොකක්ද උනේ කියල හිතා ගන්න බැරුව මාව එක සිය ගානට ගැහෙන්න ගද්දි..

සුවඳයි.. බයයි.. ගැහෙනවා ඔක්කොටමත් වඩා.. ක්ශනයෙන් මමත් ඉවත් වෙන්න හැදුවත් කොහෙද ඒ දරදඬු විශාල අත් එක්ක මට ඔට්ටු වෙන්න බැ.. බැරිම තැන ඇස් උස්සලා බැලුවේ මොකද කියල යි.. තත්පර ගානකට පස්සේ ඔහුම මාව ඈත් කරේ ලන් කර ගත්තටත් වඩා ඉක්මනට.

"තමුන්ගේ අයියා බලන් උන්නා.."

මටත් පස්සෙයි කරේ මොකක්ද කියල තේරුනේ.. කියාගන්න තේරෙන් නැ මොනවාවෙන්න යනවද්දෝ කියල.. ඔහේ ඉවත බලාගෙන උන්නේ බර සුසුමක් හෙලලා.

මිනිත්තු 15කට විතර පස්සේ එයාගේ අම්මයි අප්පච්චි ආවේ අපි උන්නු තැනට.. මග එනවා දැකලම මන් අසුනෙන් නැගිට්ටේ ඒ අව්‍යාජ හිනාවල් දැකලා. විශ්වාසයි මේ කිසි දෙයක් ඒ දෙන්නා නොදන්න වග.

"දේනි මැතික.. බෝනික්කියෙක් වගේ.."

සියුම් ලැජ්ජාවක් එක්ක කෙටි හිනාවක් දැම්මේ කිසිත් නොකීයායි..

"එන්නෝනි හොඳේ අපේ ගෙදර ඉක්මනට.. "

ඒකටත් හිනාවකින්ම සංග්‍රහ කරලා නිකම් උන්නේ අපේ අම්මා අප්පච්චි අයියත් තුන් දෙනාම ත් එතනට එද්දි.

"එහෙනම් අපි ගිහින් එන්නම් දේෂ්ණි.."

හිනා වෙලා ඔලුව වැනුවේ අපේ අම්මි පිටිපස්සෙ ඉදන් වදින්න කියල ඉගි කරද්දි.. ඒ දෙපලගෙම ආශිර්වාදය ත් අරගෙන පැත්තකට වෙන්න හදද්දිම අම්මි

"දේෂ්ණි අයියටත් කතා කරන්න පුතේ.."

සද්දෙට එහෙම කිවයින් මොකුත් කරගන්න බැරුව.. ඒ දෙපාත් අල්ලලා වැන්දේ ඔහුත් සාමාන්‍ය විදියටම ලස්සන හිනාවක් පාලා ඔලුව අත ගාල උරහිසෙන් අල්ලලා නැගිට්ටවද්දි.. මන් විතරක්ම වෙන්නැති දන්නේ ඒ හිනාව කොයි තරම් මවාපාපු එකක්ද කියල..කොහොම හරි ඒ කට්ටියත් යන්න ගියා.. අපේ තුන් දෙනා මගේ මූණ හොදට ස්කෑන් කරන්නේ කිසිම සතුටක් මගේ මූණේ නොතිබ්බ හින්දු වෙන්නැති.. මන් වචනයක් කියන්නකම් තමයි මේ බලන් ඉන්නේ හිතිලම

"මට දැන්ම මැරි කරන්න බෑ අප්පච්චි.."

"දැන්ම මැරිකන්න බැරිද නැත්නම් ධීර් ට අකමැතිද දේෂ්ණි"

"අනේ අප්පච්චි මොන අකමැතිද මෙයා මේ පූසි වගේ උන්නට මන් ඉස්සල්ලා කෝල් එකකට එලියට එද්දි මෙයා ඒකාගේ කරේ"

ඒ අයියයි.. ධීර්ටත් ඕනි උනේම මේ දේ තමයි. එතනින් එහාට තවත් කතා කරලා තේරුමක් නැති කමට කාමරේට වැදුනේ කිසිත්

නොකියායි.. ඇති වෙනකම් අඩල අඩල හෙම්බත් වෙලා නොකාම නිදා ගත්තේ හෙට චුට්ටක් ගෙදරින් එළියට යනවා කියල හිතාගෙනයි.

අප්පච්චි ත් අයියත් උදෙන්ම කම්පැනියට යද්දි අම්මිටත් කියල 9 ට විතර මාත් එළියට බැස්සේ පයින් මයි.. කාර් එක අයියා අරන් යනවනේ.. ටිකක් නිදහසේ ඉන්න රිලැක්ස් වෙන්න ඉමාටයි අනිත් සෙට් එකටයිත් කියල අපි කට්ටියම සෙට් උනේ රිවර් පැලස් හොටෙල් එකට ඩේ අවුට් එකකට. ගොඩක් වෙලාවට අපි ඒකට යනවා බීච් පාටි එහෙම ගන්න..හොටෙල් එක ඉස්සරහ තියෙන්නේ බීච් එක. ඉස්සරහ සන් බාත් කරන බෙන්ච් ඒම එක පෙලට 100ක් විතර ගහල තියෙනවා.. අපිත් ආසම ඒවට වෙලා නිදහසේ කකා බිබී ඉන්න. දවසෙම කෑම බීම ඔක්කොම හොටෙල් එකෙන්..ඉතින් වෙනදා වගේම පේමන්ට් එකත්කරලා අපි ආවේ අපේ සුපුරුදු කෙරවලේම තියෙන බෙන්ච් සෙට් එකට..
තිබ්බ ස්ට්‍රෙස් එක සෑහෙන දුරකට අඩු උනා ඇත්තෙන්ම කට්ටිය එක්ක පිස්සු කෙල කෙල ඉද්දි.. විටෙක තනියම කල්පනා කර කර උන්නු වෙලාවල්ද නැතුවම නෙමේ.. ඒත් කට්ටියම හේතු කියන්න බැරුකමට හිනා වෙලා උන්නා ඒ හැමවෙලේම.

හවස 4 ට විතර ඇති.. හොටෙල් එකෙන් දුන්නු ෆෲට් ජූස් එකත් තොල ගගා අපි ඇවිදන් ගියේ කට්ටියම රැල්ල පාගන්නයි. අනිත් සෙට් එක මට ඉස්සර වෙද්දි මන් හෙම්හිට ඇවිදන් ආවේ පිටිපස්සෙන්.. ඒත් එක වරම ඉස්සරහට තිබ්බ අඩිය එහෙම්ම ගල් උනේ ඉස්සරහට ආපු කෙනා දැකලයි. තනියම නම් නෙමේ. අපි වගේම එයාගෙත් යාලුවෝ කියන්න පුළුවන් සමවයස් සෙට් එකක් එක්ක..

පුදුමයක් ඒ වෙස් පෙරලීම.. ලස්සනට හිනා වෙලා ලගට අර ගත්තේ

"ගායිස් මෙන්න මන් කිව්වා වගේම පෙන්නුවා ඕන්... මගේ කියූට් ගර්ල්ෆ්‍රෙන්ඩ් තව ත්‍රී වීක්ස් වලින් මගේ කියූට් වයිෆ්.. හාවී.. අපේ හිටපු S.S.P භානුදේව නානායක්කාර ගේ ඩෝටර්"

"වාව් වාව් වාව් ඩීර්.. බදින්න බැ කිය කිය උන්නු උඹටත් ඒනම් අපිටත් හොරෙන්ම මගුලක් කන්නත් ලෑස්තිය නේ.."

කතා නම් ගොඩයි.. විහිලු තහලු.. ඒවා ඇහිලා මදි පාඩුවට අපේ උන් ටිකත් ආවේ උන්ටත් හැංගුවනේ ගගා වැලපි වැලපි.. හැමෝටම පේන්න හිනා වෙලා උන්නට හිත ඇතුලෙන් නම් ගිනි ගොඩක උන්නෙ මන්.. කමක් නෑ ඕනි දෙයක් වෙච්චාවේ තනි මම මොනා කරන්නද හිතලා පාඩුවේ උන්නේ කිසිත් නොකියායි.. කට්ටිය හොදට කසුකුසුව.. මෙයා මගෙන් නම් ඈත් උනේම නෑ.. මිනිත්තු කීපයකට පස්සේ

"වස්තු අපි වොලි බෝල් ගහන්න යන්නේ එහා පැත්තේ කෝට් එක.. එනවද ඔයාලත්.."

මොන රගපෑමක්ද දෙයියනේ මේ.. මගේ හිත මගෙන්ම අහද්දි. ගත් කටටම

"අනේ බෑ.. ඔයාලා සෙල්ලම් කරල එන්න.." කියල පැත්තකට උනත්.. අපේ උන්ටත් කොල්ලෝ ටිකක් කිවම ඕන් නැති දෙයක් නැනේ..

"අනේ භාවී අපිත් යන්කෝ ප්ලීස් ප්ලීස් " ගගා වද දුන්නයින් අකමැත්තෙන්ම ඒ පැත්තට ගියේ ඕන දෙයක් කියල යි. දෙගොල්ලොම සෙල්ලම් කරනවා.. මට නම් සෙල්ලම් පෙනිලා උන්නේ.. පැත්තකට වෙලා එයාලා සෙල්ලම් කරන දිහා බලන් උන්නේ වෙන කරන්න දෙයක් නැතිකමට. ඔහුත් ටිකක් සෙල්ලම් කරල ඇවිත් මන් ඉදන් උන්නු තැන එහා පසෙකින් අසුන් ගත්තේ සුපුරුදු යක්ශ මූඩ් එක හදගෙන.

"තමුන්ගේ ෆෝන් එක කෝ"

ගැහෙනවා උස් හඬින් කතා කරද්දිත්..

"බි..බෑ..ග් එකේ.."

"ගන්නව බලන්න එළියට.."

ඉක්මනට බෑග් එක ඇරලා ෆෝන් එක බලද්දී.. මිස් කෝල්ස් 2ක් තියෙනවා.. SSP ගෙන්. එසැනින් ෆෝන් එක උදුරල අරන් මොනාද බැලුවේ මටත් රව රව.. මිනිත්තු 2 ක් විතර බලල බලලා ආයෙම දුන්නා.

"ආයෙම මගෙන් එක කෝල් එකක් වත් මිස් වෙන්න බෑ. ඕකේ.. මට තමුන්ගේ ගෙදර උන්ට කතා කර කර තමුන් ඉන්නේ කොහෙද කියල අස්සවන්න ලෑස්ති වෙන්න එපා ආයෙම.. මේක ෆස්ට් ඇන්ඩ් ලාස්ට් වෝනිත් එක"

"හ්ම්" කියල පැත්තකට උනේ කියවත් ගිහින් වැඩක් නෑ කියල හිතිලයි.

"අනික මොනාද ඔය ඇදන් ඉන්නේ.. තමුන් ආයේ ඔය විදියට අඳින්න බෑ"

චූටි ශෝට් එකට හීනි පටියක් බෙල්ල වටෙන් දාල ගැට ගහන චූටි ස්කිනර් එකක්. අපි බීච් එකට අඳින්නේ මෙහෙමයි.

ඒකටත් කිසිත් නොකියම ඔලුව වනලා ඉවත බලාගෙනම මන් නැගිට්ටේ ඉස්සල්ලා යන්න හම්බුන් නැති මූදු රැල්ල පාගන්නයි.

"කොහෙද යන්නේ තමුන්"

"අර පැත්තට.." කියල මුහුද පැත්තට අත දික් කරේ ඔහුත් ඉඳන් උන්නු අසුනෙන් නැගිටලා ඒ පැත්තට යන්න අඩි තියද්දී. දැන් නම්

බෑත් වගේ.. ආයෙම යන්න බෑ කියන්න බැරිකමට මාත් හෙමිට අඩි තිබ්බේ ඒ පැත්තටයි. සනීපයි කකුල් වලට දැවටෙද්දි සීතල රැල්ල..ආසයි රැල්ල ඇවිත් ආයෙම යද්දි වැලිත් එක්කම අපිවත් යන්නමට ඉස්සරහට ඇදිලා යන ෆීලින් එකට.. ටිකක් වෙලා එහෙම උන්නේ මත් තනියම පැත්තකට වෙලා..ටිකක් එහායින් මගේ පිටිපස්සට වෙන්න ඔහුත් මුහුද දිහා බලන් ලොකු කල්පනාවක.. ටික වෙලාවකින්

"ආහ්..පට්ට කඳ.. කෙල්ලේ.. මොකද මේ තනියම මිම්මි" කියාගෙන කොල්ලො දෙන්නෙක් මගේ ඉස්සරහට ආවේ.. උන් ඇග දිහා බලපු විදියට මට පුදුම තරමේ අපහසුවක් දැනෙද්දි..

ඒ ක්ශනයෙන්...

## 4 කොටස

කොල්ලෝ දෙන්නවම පිටිපස්සට ඇදල අරගෙන බිම දාගෙන ගහන්න පටන් ගත්තේ මාව හීතල වෙලා යද්දි.. හුස්ම ගන්න බැරි සයිස් එකට ගහගෙන ගහගෙන ඉන්නේ කොල්ලෝ දෙන්නා කෙඳිරිත් ගාද්දි.. තවත් බලන් ඉන්න බැරිම තැන මැද්දට පැනලා ඒ හැඩි දැඩි දෑත් දේතින්ම බදා ගත්තේ දැන් ඇති කියන්නයි.. ඒ ටිකට කොල්ලෝ දෙන්නම නැගිටල දිව්වේ මට පිං දීගෙන වගෙයි.

ඔව් ඒ දෙන්නා දිව්වත් හරි මන් බලාපොරොත්තු උනා වගේම ඒ තරහා මගේ පැත්තට හැරෙන්න තත්ත්පරයක් ගියේ නෑ..

"උඹට උඹට මන් කිව්වා නේද ඔහොම අදින්න එපා කියල ආ.. කිව්වා නේද.." වියරුවෙන් වගේ කම්මුල් දෙපැත්තෙන් මිරිකගෙන එහෙම කිවේ.. ඒ රිදිල්ලට කඳුලු කැට වැක්කෙරෙද්දි.. කඳුලු ගානක්

තැහැ ඔහුට. කේන්තියට ඇස් රතුම රතු වෙලා.. තවත් ඉවසන් ඉන්න බැරිම තැන

"අනේ..ත් රිදෙනව අයියේ.." කිව්වේ ඉකි ගගහා.. සැනෙකින් යම් දෙයක් මතක් උනාක් මෙන් මගෙන් ඈත් උනේ ආපසු වොලිබෝල් කෝට් එක පැත්තට. හිත දුන් නෑ ඒත් ඒ පස්සෙන් යන්න. ඉතින් ආයෙම මූද පැත්තට හැරුනේ.. චුට්ටක් රැල්ල පාගන්න ආස හිතිලයි.. ඒත් තත්පර ගානකින් බඳ වටා අත් යවලා දේතටම අරන් හරහට ඉස්සුවේ මාව මට කිසිත් හිතා ගත නොහැකි වෙද්දි.. ඔව් ඒ ඔහුයි.

"මො..ක..ක්..ද කරන්න.. යන්..නේ" ගොත ගගහ ඇහුවේ බයටමයි..

"ආයෙත් සැරයක් කොහෙවත් ඉන්න ගෑනියෙක් හින්ද කොල්ලෝ එක්ක ගහගන්න බෑ මට.."

"හ්ම්" කියල ඉවත බලාගත්තේ තවත් කියවන් ගිහින් වැඩක් නැති කමටත්.. උස්සන් ගියේ වොලිබෝල් කෝට් එක ලගට නම් නෙමෙ. අපි කලින් උන්නු අපේ ඇඳුම් බෑග් ඒම තිබ්බිබ බෙන්ච් ලගට. එයා එහෙම්ම මාවත් බිමින් තියලා බෙන්ච් එකක ඇල වෙද්දි.

"ඇඳුම් දාගෙන එනව ගිහින්, හෙලුවෙන් නටන් නැතුව"

කිසිත් නොකියාම මගේ ඇඳුම් බෑග් එකෙන් ඇදන් ආපු සැහැල්ලු කෙටි ගවුම අරගෙන චුට්ටක් පිටිපස්සට ගිහින් මේ ඇදුම උඩින්ම දා ගත්තේ.. අපි හැමදම එහෙම තමයි කරන්නේ. ගෙවල් වලින් එන්නෙත් මේ ඇඳුම යටින් ඇදගෙන උඩින් ගවුමක් දන්.. යන්නෙත් ඒමයි.. ඒකට විනාඩියක් වත් ගියේ නැති හින්ද පුදුමෙන් වගේ මන් දිහා බැලුවේ ඇස් උස්සලා.. ඒ බැල්මට නම් ටිකක් හිනා යාගෙන ආවත් හිනා වෙල දතක් දෙකක් බඩට යවාගන්න වෙයි කියන බයට සද්දේ නැතුව උන්නේ එහා පැත්තේ බෙන්ච් එකට වෙලා ඉවත බලාගෙන.

මිනිත්තු 10 ක් විතර ගියාට පස්සේ නිකමට හැරිලා බැලුවම හොදට නිදි. නිකම් ඉද්දි යක්ශ මූඩ් උනාට. නින්ද ගියාම නම් පූස් පැටියෙක් වගේ. ඇහෙන නෑහෙන ගානට හෙමීට අඩි තියල ගිහින් මුලු සර්වාංගෙම පොඩි ස්කෑන් එකක් දලා බැලුවේ.. ඇහැරිලා ඉන්න වෙලාවට ස්කෑන් තියා ඔලුව උස්සලා බලන්න බය හින්දයි.

ඇත්තෙන්ම හරිම ලස්සන කඩවසම් රුවක්. උඩට උස්සපු තරමක් දිගු සිනිදු හිසකෙස්.. මූණ පුරා වැවුණු දිගු ඝනකම් රැවුල.. ඝන ඇහිබැම්.. සුදුත් නැති තලෙලුත් නැති හම. හෑන්ඩ්කට් ටී ශර්ට් එකට කැපිලා පෙනෙන සුවිසල් අත පය පපුව.. ඇත්තෙන්ම මේ ගෙවුනු පැයටම බීච් එකේ උන්නු කෙල්ලො බැල්ම දැම්මේ නැ කිවොත් නම් බොරුවක්.. එවන් රුවක් ඔහුට තිබුනා.. මන් දන් නැ ඇයි මොන හේතුවකට මට මෙහෙම කරන්නේ කියන්න.. ඒත් විශ්වාසයි ඒකට ලොකු හේතුවක් එයා ලග ඇතියි කියන්න. ලාවට නැමීගෙනම ඒ මූණ දිහා බල බල උන්නු මාව එසැනින් ගැස්සිල ගියේ එක පාර ඒ පපුවට ඇද ගනිද්දියි.. වැඩි බර නැති මම කෙලින්ම මන් ඒ පපුව උඩ.. මම ඇස් තදින් පියා ගත්තේ ඊලගට මොනවා වෙයිද කියල බයටයි..

කිසිත් කතාවක් නැ..

"යකෝව් මේ යකා නින්දෙන් වත් ද.."

හම්මේ නින්දෙන් නම් කොච්චර දෙයක්ද කියල දැනුනු සතුටට හිනා වේගනම ඇස් ඇරියයින්.. ඒ ඇසුත් මන් දිහා වෙද්දි.. ගැස්සිලා ගියේ අද නම් ඉවරයි හිතිලයි..

"ආස ඇති නේද තමුන් මෙහෙම කොල්ලෝ එක්ක නටන්න.."

හිත රිදුනත් පෙන්නන්න ගියේ නැ.. ඒ වෙනුවට ඔහුගෙන් ඉවත් වෙන්න හැදුවත් නැ ඉඩක්.

"ය..න්..න දෙන්..න..ප්..ලී..ස්"

වාවගත්තු ඉකියකින් එහෙම කියල ඉවත් වෙන්න හැදුවත්. නෑ ඉඩක්.

"මට එක පොරොන්දුවක් ඕනා.. තමුන්ගෙන්..ජීවිත කාලෙටම කැඩෙන්න බැරි පොරොන්දුවක්"

ටිකක් බය හිතුනත්.

"මො..ක..ක්..ද?"

"කිසිම දවසක මට ආදරේ කරත් නෑ කියල.. මේක නිකම්ම රඟපෑමක් විතරයි. ඒ වගේම මට තමුන්ගෙන් මොකුත් ඕනෙත් නෑ.. මගේ යාලුවෝ නෑයෝ අම්මා අප්පච්චි තමුන්ගේ ඒ ඒ කට්ටිය ඉස්සරහ රගපෑමක් විතරයි. එතනින් එහාට මන් තමුන්ගේ ආදරේවත් එහෙමත් නැත්නම් තමුන් එක්ක සෙක්ස් කරන්නවත් ඕනා කමක් නෑ.."

ඇත්තෙන්ම මොකක්ද මේ කියන දේවල්වල තේරුම කියල හිතා ගන්න බැරිව මන් ඔලුව වැනුවේ කිසිත් නොකියායි.

"පොරොන්දු වෙන්න.."

"ප්‍රො..මි..ස්.."

"මොනා ප්‍රොමිස් ද?"

"ම්ම් මං ප්‍රොමිස්.."

"ඒ කියන්නේ පොරොන්දුව කැඩුවොත්..?"

"යෙප්..මැරෙයි මාව.."

කිසිත් ගානක් නැතුව ඒ ටිකත් කියල දැම්මේ ඔහුත් තරමක් පුදුමයෙන් බලද්දි. එසැනින් මා වටා තදින් බැඳ තිබුනු දෑත් ලිහිල් කරේ ඔහු, මාත් කඩිනමින් ඔහුගෙන් ඉවත් වෙද්දි.. ආයෙත් සැරයක් ඔහු දෙඇස් පියාගනිද්දි මත් හෙමිහිට අයිනකට උනේ එහා පැත්තේ චූටි ෆොරින් බබාලා දෙන්නෙක් මූදු වැල්ලෙන් වැලි සෙල්ලම් කරනවා දැකල ඒ පැත්තට.. විශ්වාසයි ඇස් පියන් උන්නට ඔහු නිදි නොමැති බව. සියල්ල පිස්සුවෙන් වගේ ඔලුව වටෙන් කැරකෙද්දි.. ඒ චූටි පැටික්කියෝ දෙන්නා ලගින් වාඩි උනේ ඒ දෙන්නත් හිනා වෙලා මට ඉඩ දෙද්දි..

"හේයි ප්‍රින්සස්.."

"හේයි..ක්වීන්න්.."

දෙන්නා හරි හුරතල්..හිනා වලින් පිරිලා ඒ මූණු.. මටත් දෙනවා අතට එයාලගේ ටූල්ස්. එයාල එක්ක සෙල්ලම් කරන්න එන්න කියල .. චූටි කාලේ ඉදන් සෙල්ලමට ආස මමත් ඒ පුංචි පැටව් දෙන්නා එක්කම වැලිමාලිගා හද හද කාලය ගත කරේ මදකට ප්‍රශ්න සියල්ලම අමතක කරමින්.

"ධීර්.."

"ආහ් ටෙහා..සෙල්ලම් කරල ඉවරයි ද බන්"

"නෑ බන් කොල්ලෝ කෙල්ලෝ ටික තාම සෙල්ලම. උඹ කෝ බලන්න ආවේ..කෝ කෙල්ල"

"අර"

"ඒකි පෞ බන්..උඹ මේ කරන දේ හරිද.."

"මට මගේ එකීගේ පලිය ගන් නැතුව මැරිලා යන්න කියල ද උඹ කියන්නේ "

"ඒත් මේ අහිංසකී ඒ කිසිම දේකට සම්බන්ධ නෑ බන් ඒක උඹ හොදටම දන්නවා.. උඹ ඒක තේරුම් ගන්නේ කවද්ද?"

"ඒත් මේකි ජීවිතේ විදින විදියට මගේ එකීට ජීවිතේ විදින්න බැරි උනා.. බැරි උනා නෙමේ බැරි කරා.."

"ධීර් මන් කියන්නේ මේ අහිංසකී ඒ කිසි දෙයක් දන් නෑ...."

"ටෙහා ප්ලීස් බන්.. ඉනෆ්ෆ්.."

"හ්ම් අනේ මන්ද බන්.. මන් අන්තිම වතාවට මේ දේ ගැන කිවේ.. ටිකක් හිතල බලහන්.. මන් යනවා ආයෙම කෝට් එකට. එන් නැද්ද උඹලා දැන්ම"

"තව ටිකක් ඉදල එන්නම්"

එයත් එක්ක ආපු අයියා කෙනෙක් මටත් අත වනාගෙනම ඉවත්ව යනව දැක්කත් කතා කරපු කිසිම දෙයක් මට ඇහුනේ නම් නෑ.. එදා දවසත් ඒ විදියට ඉවර වෙද්දි මන් බලාපොරොත්තු උනා වගේම අම්මි අප්පච්චි එදා කෑම මේසෙදි හරි සතුටින් කිවේ රෙජිස්ට්‍රේශන් එක ත්‍රී වීක්ස් වලින් ගමුයි කියනව කියල යි.. කිසිත් නොකියා ඔළුව වනලා ආවේ ඕන දෙයක් කියල යි.

ඔය සති තුනට එයාගේ අම්මා අප්පච්චි ඒ හැමෝම අපේ ගෙදර තමයි ගොඩක් වෙලාවට.. රෙජිස්ට්‍රේශන් එක ලෑස්තිකරවන්න.. අපිට

කියල කරන්න වැඩ ගොඩක් තිබ්බේ නෑ.. ඩ්‍රෙස් එකට මෙශර්මන්ට්ස් දෙන්න තිබ්බා. ඒක ටේලර් මේඩ් ම ඕනි කියල. ගෙවල් වතු පිටි එලි වෙද්දි කොහොමින් කොහොම හරි ඔත්ත ඒ දවසත් ලන් උනා.. ඔව් හෙටයි ඒ දවස. රෙජිස්ට්‍රේශන් එක තියල මාස තුනකින් වෙඩින් එක ගන්න ප්ලෑන් කරන් උන්නත් මට නම් ඒ ගැන කිසිම විශ්වාසයක් නෑ.. රෙජිස්ට්‍රේශන් එක කරලත් මන් යන්නේ එයාගේ ගෙදර ටම තමයි. ඊට පස්සේ මොන වෙඩින් ද.. ඒකම වෙන්නැති රෙජිස්ට්‍රේශන් එක ලොකුවටම ගමුයි කියල කට්ටිය කතා වෙන්නේ.. මෙච්චර හදිසියෙන් රෙජිස්ට්‍රේශන් එක ගන්නේ එයාට ට්‍රේනින් එකකට අබ්‍රෝඩ් වෙන්න තියෙනවා.. ඊට කලින් මාව එක්කන් යන්න ඕනි කියල තමයි කියන්නේ නම්.. අනෙ මන්ද මන් දන් නෑ මොකක්ද ඇත්තම හේතුව කියන්න. ඒ වගේම හෙටින් පස්සේ මගේ ජීවිතේ මොන පැත්තකට හැරෙයිද කියන්න..

මේ සති තුනෙයි කියල සැලූන් ගානේ යන්න කියල අවශ්‍යතාවයක් මට තිබුනේ නෑ.. ඊයේ ගිහින් ක්ලීනප් එකකුයි ෆේශල් එකකුයි දන් ආවා එච්චරම තමයි.. අමුතුවෙන් නග්ගලා ගන්න ඕනි හමක් නෙමෙ මට තිබුනේ උපතින්ම සුදු ලස්සන ග්ලාස් ස්කින් එකක්. මේකප් එකක් නොද උනත් ඉන්න පුළුවන් නැචුරල් ලුක් එකක්.. අපේ අම්මිගෙන් තමයි ඒ හැමදේම නම්.. එයත් හරිම ලස්සන ගැහැණියකට තියෙන්න ඕනි හැමදේම හරු ලස්සනට මික්ස් වෙලා තිබුනු පිංවත් පෙනුමක් එයාට තිබ්බ.. මටත් ඒක ඒ විදියටම තියෙනවා.

සියල්ල ස්වභාවධර්මයට භාර දීලා මන් උන්නේ ගෙනියන්න ඕනි කරන ඇඳුම් බෑග් ලෑස්ති කර කර.. අම්මිත් ඇවිත් සෑහෙන වෙලාවක් කතාකරල අඩල.. කවද දූන්නත් දූලා පිටටනේ කියල හිත හදගෙන යන්න ගියේ රෑට කෑමත් කාලා මන් සුව නින්දකට වැටෙද්දි.. හිතට නම් කිසි සුවයක් නෑ.. ඇග පතේ තිබුනු තෙහෙට්ටුවට හොඳටම නින්ද ගියේ පහුවද උදේ අම්මි ඇවිත් ඇහැරවනකම්ම. වෙඩින් එකේ වගේ චාරිත්‍ර මොකුත් නැති හින්ද.. නිවාඩු පාඩුව ඇඳගන්න ඕනි තරම් වෙලා තිබුනා.. රෙජිස්ට්‍රාර් කරන නැකත තිබ්බෙත් 10 යි ගානකට.

අන්දවන අක්කිත් ඇවිත් තිබ්බා වෙලාවටම.. වොශ් එකක් දගෙන එහෙම මමත් ලෑස්ති වෙලා උන්නේ එයා එද්දි. මගේ ඩ්‍රෙස් එක මම දැක්කෙත් එවෙලෙයි. ඔක්කොම ධීර්ගේ කැමැත්තටයි උනේ.. හිතුවට වඩා මාරම ලස්සනයි ඒ ඩ්‍රෙස් එක..ලෙහෙන්ගා එකක් ග්‍රීන් කලර් ලා පාට නෙමේ රෝයල් ග්‍රීන් කලර් එක..අර තද පාට දිලිසෙන ග්‍රීන් කලර් එක.. ජැකට් එක කොටස ලස්සන ශයින් රෙද්දකින් අත් හීනිවට කර කොටස ඕපන් හිනි පටි පටි ගිහින්.. හරිම ලස්සනයි.. ඇගේ ගානටම, ටයිට් එකට.. ස්කර්ට් එක කොටස තනිකර චූටිම චූටි තට්ටු තට්ටු තට්ටු තනියක හිතිම හීනි තට්ටු තට්ටු විදියට උඩ ඉදන් යටටම තට්ටු 50 ක් විතර.. ඈතට පේන්නු චූටි පිහාටු වගේ. ඒත් පිහාටු නෙමේ... ඒක චූටිවට අල්ලපු තට්ටු තට්ටු.. ශෝල් එකත් නෙට් රෙද්දෙන් වටේට අර විදියටම තට්ටු තට්ටු දලා.. කියාගන්න තේරෙන් නෑ මොනා උනත් ඇදන් ඉන්න ආස හිතෙන ඩ්‍රෙස් එකක්..

ජුවෙලරිස් එවල තිබුනේ සිල්වර් කලර් එකට රෝයල් ග්‍රීන් කලර් මික්ස් කරලා.. ඒක හරි චාම් නෙක්ලස් එකක්. ස්ටෝන්ස් තියෙන්නේ රෝයල් ග්‍රීන් කලර් එකෙන්.. නෝර්මල් සිල්වර් ප්ලේට් එකකට තමයි ඒ විදියට ස්ටෝන්ස් අල්ලලා තියෙන්නේ.. බැන්ගල් දෙකත් නෙක්ලස් එකේම ඩිසයින් එකෙන්.. ඉයරින්ස් ජෝඩුවත් ඒමමයි.. හරිම චාම්.. හරිම කියුට්.

චාම් මේකප් එකක් දලා..ඉන දක්වාම දිගුව වවලා තිබ්බ කොන්ඩේ කඩලා දලා.. රෝයර් බ්ලූ කලර් එකෙන්ම හදල තිබුනු ආර්ටිෆොශල් රෝස මල් වගයක් ගැහුවේ පිළිවෙලට ලස්සනට.. සිල්වර් කලර් එකෙන්ම හීල් දෙකත් දලා.. අක්කි ෆොටෝස් වගයක් ගත්තේ එයාගේ පේජ් එකේ දන්න කියල යි...

අම්මි නම් අඩනවා.. මටත් ඇඩෙනවා.. අක්කි සැරින් සැරේට කඳුලු වැටෙන්න නොදී.. ටිශූස් තිය තිය මේකප් එක නෝර්මල් තියාගන්න ට්‍රයි එක.. අම්මි අප්පච්චි අයියා.. තුන් දෙනාම ඇදගෙන.. මගේ ග්‍රීන්

කලර් එකටම ගැලපෙන්න... ලගම නෑදෑයෝ දහ පහලොස් දෙනෙක් එක්වුනා මගේ යාලුවෝ සෙට් එකත් උන්නා අපිත් එක්ක.. ඩීර් ම සිලෙක්ට් කරපු හොටෙල් එකකට ඒ පැත්තෙනුත් නෑදෑයෝ 10ක් 15ක් එක්වෙලා තිබුනා.. එදා බීච් එකේදි හම්බුන යාලුවෝ ටිකත් උන්නා..

කඩවසම් ඔහු.. මගේ ග්‍රීන් කලර් ඩ්‍රෙස් එකටම මැච් වෙන්න කෝට් එකයි ට්‍රවුසර් එකයි..හිනා නොවී බැරි කමට දකින දකින හැමෝම එක්ක හිනා උනේ අම්මාට අප්පච්චි ට පවා මත් ඉන්නේ බොහොම සතුටින් කියල පෙනෙන්න එක්කයි. නැකත උදා වූවායින් හැමෝම ඉදිරියේ නීතිය ඉදිරියේ පොරොන්දු වෙලා අත්සන් කරලා මුදු මාරු කරලා ඔය ටික ඉවර කරේ හිතකින් නම් නෙමෙයි. මගේ දෛවය මේක වෙන්නැති කියල හිත හදාගෙන හිනා වෙලා උන්නේ වෙන කරන්න දෙයක් නැති කමටයි.

අවුරුදු 24 ක්ම අම්මා අප්පච්චි අයියා එක්ක හුරතල් වෙලා වෙලා ජීවිතේ ඉතුරු කාලේ මේ විදියට කන පිට හැරුනුඑක ගැන නිශ්චිත නැති අනාගතයක් උන එක ගැන මත් උන්නේ කලකිරීමෙන්.. වගේම ඊටත් වඩා දුකින්.. කෑ ගහල අඩන්න බැරි කමට එදා උදේ ඉදන් හවස් වෙනකම්ම ඉවසන් උන්නේ හරිම අමාරුවෙන්. දැන් යන්න ඕනි කියල ඇහෙද්දි නම් තවත් දරන් ඉන්න බැරි උනා.. අම්මා අප්පච්චි අයියා තුන් දෙනාටම තුරුල් වෙලා හිතේ හැටියට ඇඩුවේ එයාලා ලග අන්තිම වතාවට සැනසිලා.. තවත් කල් ගත කරන එක පිටස්තරයන්ට විහිලුවක් වේද්‍රෝ බයටම ඇඩුම් නවත්තලා යන්න හිත හදා ගත්තේ ඔහු එක්කයි. ඔව් හැමෝටම පේන්න හරි ආදරෙන් තුරුල් කරගෙන අපි පිටත් උනේ හැමෝගෙම අවංක ආශිර්වාදය මැද්දෙන් ඔහුගේ යැයි කියූ නිවසකට ... ඔහුගේම කාර් එකේ..

හොටෙල් එක පහු වෙලා ටික දුරක් එද්දිම.

"ඔය ඇඩියාව නවත්තගනින් දැන්වත්. මට එපා වෙනවා ඩ්‍රයිව් කරන්නත්"

උස් හඬින් එහෙම කියද්දි අපහසුවෙන් හැඬුම් මැඩගෙන වාහනේ වීදුරුවෙන් ඉවත බලාගත්තේ කිසිත් නොකියායි.. පැය 4 ක 5 ක පමණ ගමනකින් පස්සේ අපි ආවේ ලොකු.......වත්තක් මැද්දක තිබුනු.. හරි ලස්සන ගෙදරකට.. ඇත්තෙන්ම හොදට මේන්ටේන් කරන් යන වත්තක් ගෙයක්.. කිසිම පාලු පාටක් නෑ.. දකිද්දි ආසයි.. ඒත් වත්ත වටේටම උසම උස තාප්ප.. සුවිශාල ඉලෙක්ට්‍රික් ගේට් එකක් එක්ක. රිමෝට් එකකින් ඇරුනු ගේට් එකෙන් ඇතුලට දලා වාහනේත් නවත්තලා ඔහු දෙරත් ඇරන් එළියට බැස්සේ

"කුමාරිහාමිගේ බඩු ගෙනියන්න මෙහෙ වැඩකාරයෝ කවුරුත් නෑ අරගෙන එනව ඇතුලට.." කියල යි

කමක් නෑ මීට වැඩි දෙයක් මන් බලාපොරොත්තු උනෙත් නැති එකේ.. කිසිත් නොකියම බැගේජ් 3ක් විතර තිබ්බා.. චූටි එකයි ලොකු දෙකකුයි.. තුනම එළියට අරගෙන එකින් එක ගෙතුළට අරන් ගියේ මන් තනියමමයි.

කලින්ම දැවැදි එපා කියල කියල තිබ්බත් අප්පච්චි ලා ගෙදර ට ඕනි කරන බඩු ඔක්කොම වගේ වැඩි වැඩියෙනුත් එක්ක ෆ්‍රිජ් එකේ වොශින් මැශින් එකේ ඉදන් චූටි කුලිබඩුවට වෙනකම්ම මිදුලේ තියන මල්.පැලද ලී බඩු ගෙදර කට ඕනි හැම දෙයක්ම මෙහෙට ගෙනල්ල්ලා පුරවලා තිබුනා.. සාලේ මැද්දට වෙනකම් බැගේජ් තුනම උස්සන් ගිහින් මන් බලන් උන්නේ මේවා කොහෙන් තියන්න කියයිද කියල යි.

"කාමරේ උඩ. උඩින් තියන්න.." කියල ඔහු මට ඉස්සර උනේ කාමරය පෙන්නන්න විය යුතුයි.. ඒකත් එකින් එක උඩට උස්සන් ආවේ ඔහුගෙන් කිසිම උදව්වක් නැතුව.. තුනම කාමරෙන් තියල මහන්සියටම ඇඳ මතින් වාඩි උනේ.. දත් උන්නු ජුවෙලරිස් ගලවමින්. කොන්ඩ කටුද ඒ හැට් ගොඩක් නැතිහින්ද ඒ සියල්ලත් තනියම.කරගන්න මට පුළුවන් උනා.. ජැකට් එක තනියම ගලවන්න නම් අමාරුයි. එහෙට මෙහෙට

කැරකි කැරකි ගලවන්න ට්‍රයි කර කර ඉද්දි සීතල අතක් කර පිටුපසින් දැනුනායින් ගැස්සිලා ගිහින් හැරිලා බැලුවයින් ඔව් ඒ ඔහුයි.. ඇදන් උන්නුකෝට් එක ශර්ට් එක ගලවලා.. ට්‍රවුසර් එක පිටින්... හීනි පටි ගිය ජැකට් එකේ පටි එකින් එක ලිහිල් කරනවා.. සියුම් ලැජ්ජාවක් දැනුනත් ආයෙම ඉස්සරහ බලාගත්තේ කිසිත් නොකියායි..

හෙමිහිට පටි සියල්ල ලිහිල් කරලා ඔහු කාමරයෙන් එළියට ගියා.. ජැකට් එක උරහිස් වලින් පන්නලා ස්කර්ට් එකත් ඉවත් කරල දලා අරන් ආපු ටවල් එකත් ඇදගෙනම බාත් රූම් එකට යන්න හැදුවේ වොශ් එකක් ද ගන්නයි..

5 කොටස

ඒත් එකවරම වියරුවෙන් වගේ මගේ ඉස්සරහට ඇවිත් ට්‍රවුසර් එකෙහි වූ බෙල්ට් එක ඇදල අරගෙන එක දිගට හම පුපුරු ගහන්න තරම් වේගයෙන් ගහගෙන ගහගෙන ගියේ මට කර කියාගන්න දෙයක් නොවෙද්දි.. කෑ ගහන්න හයියක්වත් නෑ මට.. පොඩි කාලේ ඉදන් අප්පච්චිගෙන්වත් කෝටු පාරක් නොකාපු මන් මේ සද්දන්ත අත් වලින් සවි ශක්තියෙන් වැදෙන පාරවල් කොහොම ඉවසගන්නද.. පාරවල් 10ක් විතරම අත් උරහිස් දෙපා ඔය සියල්ලන්ටම වැදුනේ.. රතු වෙලා පුපුරු ගහන්න තරම් වේදනාවක් දැනෙද්දි.. වේදනාව ඉවස ගන්න බැරි තැන

"අයියා...හ්" කියවෙනු විතරයි මතක. සියල්ල අඳුරුව ගියේ. ඇස් අරින විට ඔව් ඒ උකුල මත මගේ හිස් තියාගෙන ටයිල් පොළොවෙම ඒ ඇස් කලබලයි.. ගොලුයි.. තේරෙන් නෑ මට මේ මොනවා වෙනවද කියන්න.. පාරවල් වැදුනු තැන් රතු වෙලා ඉදිමිලා.. නැගිටගන්න බැරි තරමට පුපුරු ගහනව රිදෙනව.. තාමත් ටවල් එක පිටින් මන්.. කිසිත් නොකියම අපහසුවෙන් නැගිටින්න හැදුවත් මුවෙන් පිටවුනු කෙඳිරුමත්

එක්ක මාවත් වත්තම් කරගෙන ඔහු නැගිට්ටේ වොශ් රූම් එක දෙසටයි. කිසිත් නොකියා මමත් ඒ රුව දිහා බලන් උන්නේ දැනුනු අසරණකමටමයි. කඳුලු තාමත් වේලිලා නෑ. සැරින් සැරේ අමාරුවටම කඳුලු කැට වැටෙනවා..

ඇඳන් උන්නු ටවල් එක පසෙකින් තියල පරිස්සමට වතුර පිරුනු බාත් ටබ් එකෙන් තියල ඔහු පරිස්සමට වතුරෙන් නහවන්න ගත්තේ වචනයක්වත් නොකියා යි. මිනිත්තු කීපයකට පස්සේ තැල්ම හිටපු තැන් පරිස්සම් කරලා ආයෙම ටවල් එකෙන් පිහිදල කරල ඇඳ මතින් තිබ්බේ, මගේ ඇඳුම් තිබ්බ බෑගේජ් එක ඒ ලගට කිට්ටිටු කරලයි. කිසිත් නොකියම කාමරෙන් පිටවුනේ වෙනම කල්පනාවක. ඇඩුම් පාලනේ කරගෙන සැහැල්ලු ගවුමකුත් ඇඳගෙන මන් කල්පනා කරේ මගේ ජීවිතේ ගැනයි..

මට ටිකවෙලාවක් නින්ද ගිහින්, කන් පෙති වලට කෙහෙරැලි වලට දැනුනු සියුම් කිතියෙන් ඇහැරෙද්දි ඔව් ඔහු මගෙ ලග..

"කෑම..කන්න..පල්ලහැට යමුද.."

හා කියල ඔලුව වනලා..ඇගේ අමාරු ගනන් නොගෙනම පල්ලහැට යන්න අඩි තිබ්බේ ඔහු ඉස්සර වෙද්දි.. කෑම කාමරේට ලන් වෙද්දිම දැනුනු සුවඳත් එක්ක.. පුදුම තරම් කුසගින්නක් දැනෙද්දි.. කෑම මේසෙනුත් වාඩි කරවල කෑම බෙදන්න ගත්තේ ඔහුමයි.. හිතා ගන්න බෑ මේ වෙස් පෙරලුම.. අලහොදි හදල චිකන් තෙල් දලා පපඩම්.. එතකොට මේ වෙනකම් පල්ලහැට ඇවිත් මෙයා උයලද.. ටිකක් වෙලා ඒ රුව දිහා බලන් කල්පනා කරද්දි.. කෑම එක බෙදල දීලම මගේ ලගට කරේ.. කිසිත් නොකියා ඔහුඑතනින් ඉවත් වෙන්න හදද්දි..

"ඔ..යා.. කන් .. නැද්ද?"

නොඅහා ඉන්න හිත නොදුන්න හින්ද බැනුම් අහන්න හරි කමක් නෑ

කියල ඇහුවේ ඒකයි.

"මන් පස්සේ කන්නම්.. කාල ගිහින් නිදාගන්න.."

"හ්ම්ම්" කියල කන්න ගත්තේ තවත් කිසිත් නොකියායි.. තිබුනු බඩගින්නට පිගානට බෙදපු ඔක්කොම ටික කාලා.. අත් සෝදගෙන කිවත් වගේම කාමරේට ගිහින් නිදාගත්තේ කියන දෙයක් අහන් ඉන්න එක ඇගට ගුනයි කියල හිතිලයි. මන් හිතන්නේ ටිකක් පාන්දර වෙලා.. ඇඟ පත ටිකක් රිදෙද්දි.. එක වරම ඇහැරුනේ ඒ අමාරුවටමයි.. ඒත් ඇහැරෙද්දි මාව ඒ තුරුලටම අරගෙන, ඒ ඇස් නිදි නෑ.. ඒ වෙනුවට එයාම තලපු මගේ අත පය උරහිස් සැහැල්ලුවට පිරිමදිනවා.. බලාපොරොත්තු උනේ නෑ එවන්නක්.. ගැස්සිලා ගියේ බය උනු පාරටයි..

"ශ්.......... නිදාගන්න"

කීවේ එපමණයි. පහුවදා උදේ ඇහැරෙද්දි.. තාමත් මන් ඒ තුරුලේ.. නිසැකයි ඔහු තවමත් සුව නින්දේ බව. ටිකක් වෙලා බලන් උන්නේ ඒ මූණ දිහයි. විශ්වාසයි කාටවත් නොකියපු කතාවක් ඒ හිතේ තියෙන බව.. මාව දකින වාරයක් වාරයක් ගානේ..ඒ තුවාලේ පෑරෙන බව ... ඒත් මන් දන් නෑ ඒ මොකක්ද කියන්න.. කවදම හරි කියයිනේ කියල හිතල ලොකු හුස්මක් අතෑරලා ඔහුගේ නින්දට බාධාවක් නොවන විදියට හෙමිහිට ඈත් වෙලා ඇදෙන් බැස්සේ පල්ලහැට යන්නයි..

පෙනුමෙන් මෙහේ වැඩ කරන්න උයන්න පිහන්න කෙනෙක් සිටියෙ නැති හින්ද.. මොනවා හරි උයන්න ඕනි කියල හිතිලා කිවත් එකට අඩි තිබ්බේ. කෑම කාමරේ ඊයේ රෑ කෑම තාමත් එහෙම්මමයි. පස්සේ කන්නම් කියල එවෙලෙ කිවට කාලා තිබ්බේ නෑ. ඒ ටික හෙමිහිට අස් කරලා උදේ ට කන්න බතුයි පොල් සම්බෝලයකුයි කරවල තෙල් දලයි හැදුවා.. ඊයේ බැදපු පපඩම් ත් තියෙන හින්ද උදේ ට ඇති නේ හිතලා උඩට යන්න හදලත් උදේට කිරි බොනව ඇති හිතිලා කිරි

වීදුරුවකුත් අතැතිවමම ආයෙම උඩට යද්දි, ඔහු ඇහැරිලා.. බැල්කනියට වෙලා ඉන්නවා ලොකු කල්පනාවක..

හෙමිහිට අඩි තියල කිරි එකත් අරගෙන ඔහු ඉස්සරහට ගියේ තරමක් බියෙන්. කිරි වීදුරුව දික් කරද්දිම ඒක අතට වත් ගන් නැතුව ට්‍රේ එකත් එක්කම පොලේ ගැහුවේ, සලාන් ගාලා වීදුරු කෑලි තැනින් තැන විසිරෙද්දි.. තේරෙන් නෑ දෙයියනේ එක පාර මොනවා වෙනවද කියන්න. ඒ ක්ෂණයෙන් වියරුවෙන් වගේ මගේ පැත්තට ඇවිත් කම්මුල් වලින් මිරිකලා "උඹට කවුද මට කිරි ගේන්න කිව්වේ.. උඹ දන් නැද්ද මන් කිරි බොන් නෑ කියල " බයටම නෑ කියන්න ඔලුව වැනුවේ කඳුලු කැට වැක්කෙරෙද්දි. "දන් නැත්නම් දැනගනින් " කියල කම්මුල් අතෑරියේ මන් බයටම අඩියක් පිටිපස්සට තියද්දි වීදුරුව බිඳිල විසික් උනු වීදුරු කටුවක් සෑහෙන ගැඹුරට ඇනුනේ මට "ආහ්.. " කියවෙද්දි..

කකුල උස්සලා බැලුවම දෙයියනේ ඒක හොඳටම ගැඹුරටම ඇනිලා.. පොඩි කාලේ ඉඳන් ලේ දකින්න බය මම යටි ගිරියෙන් කෑ ගැහුවේ "අනේ අප්පච්චි " කියල යි..ඔව් පොඩි කාලේ ඉඳන් තුවාලයක් උනාම අම්මිට වඩා මට ඕනි කරේ අප්පච්චි ව.. ඒ ක්ෂණයෙන් ඔහුත් කලබල වෙලා කකුල බැලුවත් ඔහුට බය ඇති ඒක ඇදල ගන්න.. ලේ වැක්කෙරෙනව එහෙන්..

"ශ්............." කියල ඒ පපුවට තුරුල් කර ගත්තේ අඩියට දෙකට උඩට ටී ශර්ට් එකක් දාගෙන ෆෝන් එකයි පර්ස් එකයි අතට ගන්න ගමන්... හනිකට කාර් එකේ යතුරත් අරගෙන මාවත් ඩ්‍රෝනටම අරගත්තත් ඒ කලබලේට මට ඔක්කොටම වඩා බය හිතුනේ.. එයත් කලබලේට අඩි තියල ගිහින් වීදුරු කට්ටක් ඇන ගනී කියල යි.. ඇඳුම් පැත්තක තියල ඒ කර බදාගෙනම මන් කෙඳිරුවේ.. "අ..නේ පරිස්..සමින් ඔයා..ට..ත් ඇනේවී.. " කියල යි..

හම්බුන ද ඉඳන් නොදැකපු විදියේ ආදරණීය බැල්මක් දැම්මේ මටත්

ආස හිතෙද්දි.. මිනිත්තු පහට 10 ට ලගම තිබ්බ ප්‍රයිවට් හොස්පිට්ල් එකට එක්කන් ගියේ.. උන්නු ඩොක්ටර්ස් ලා නර්ස් ලා හිතක් පපුවක් නැතුව ඒ කට්ට ඇදල ගනිද්දි.. මුලු හොස්පිට්ල් එකම දෙවනක් කරා කිවොත් හරි.. ඒ හැමෝම මෙයාව අඳුරනවා SSP කියල. හැමෝම එයාගෙන් අහනවා මේ වයිෆ් ද නැත්නම් දුව ද කියල ඒ තරම් ලස්සනට හැසිරුනා මන්. ඒත් එක තත්ත්පරයකටවත් ඇත් උනේ නම් නෑ මගෙන්.. රිදෙද්දි හයියෙන් කෑ ගහද්දි ඒ පපුවට තුරුල් කරන් ඔලුව අත ගගා.. ශ්.... කිය කිය උන්නා.

කොහොම හරි මිනිත්තු 30 ක් වගේ ඇතුලත හොස්පිට්ල් එකෙන් බේනුත් දගෙන ගෙදර ආවා ආයෙම. දේනටම අරගෙන උඩට යන්න හදද්දිම

"මං කෑම හදලා තියෙන්...නේ"

"මට බඩගිනි නෑ. ඔයා කමු"

"මට ත් බඩගිනි නෑ"

"බඩගිනි හින්ද නේ උඩට එක්කන් යන්න කලින් කෑම ලෑස්ති කිවේ.. යමු කන්න."

තවත් කිසිත් නොකියා ඔලුව වැනුවේ වචන දෙක තුනකට වඩා කතා බහ කරන්න මන් බය උනු හින්දයි.. බෙදල දුන්නු කෑම එක කනකම් ඔහු ගියේ උඩට.. සැරින් සැරේ එහෙට මෙහෙට යනවා දැක්කයින් හිතුනේ උඩ වීදුරු කෑලි ටික අස් කරන්න ඇති කියල යි.. එක කකුලයිනේ කැපුනේ ඉතින්.. ඒක බිම තියන් නැතුවම කෑම කාලා අත් සෝදලා උඩට යන්න හැදුවත් උසට උසේ තියෙන පඩිපෙල දැක්කම පපුව හෝස් ගාලා යනවා.. ඇයි දෙයියනේ තනි අන්ඩෙන් කෝම තරණය කරන්නද මේක. උඩ ඉදන් පල්ලහැට එද්දි නම් ඕන් මේ ලීය දිගේ රූටන් හරි එන්න තිබ්බා.. ඒත් කොහෙද උඩට නගිද්දි මේක

දිගේ බඩ ගාන් නගින්න ඈ.. ඉනට අතක් තියාගෙන පඩිපෙලට බැන බැන ඉද්දි ලා හිනාවක් දලා උස්ස ගත්තේ ආයෙමත් ඒ අත්වලට.. ඒ හැටි බරක් නැති හින්ද උන්දැට මාව තනි අතකට උනත් ගත්තැකි.

හිතුව වගේම වීදුරු කෑලි අස් කරල ඇඳෙන් පරිස්සමට තියල ඔහු බැල්කනියට උනේ කිසිත් නොකියායි. ඇත්තටම මේ මනුස්සයා ට බඩගිනි නැද්ද මන්දන් නෑ.. ඊයේ රෑට කාලත් නෑ.. මහ අමුතුම ජීවියෙක්.. මිනිත්තු කීපයක් ගියාට පස්සේ ආයෙම ආවේ කාමරේට ඇඳුම් දෙකක් හොයන් වොශ් රූම් එකට වැදුනා.තව ත් මිනිත්තු ගානකින් එලියට ආවේ තෙත කොන්ඩෙත් ගස ගස.

"මන් එලියට යනව"

කිසිත් නොකියා ඔලුව වැනුවේ යන්නේ කොහෙද.. එන්නේ කීයටද ඕවා ඇහුවා කියල තේරුමක් නැති හින්දයි. ටික වෙලාවකින් යන්න ගියේ මන් තනි කකුලෙන් ගිහින් බැල්කනි එකට වෙලා කා එක නොපෙනෙන කම්ම බලන් ඉද්දි. පාලුවට අම්මිලට කෝල් එකක් අරන් කතා කරලා සතුටින් ඉන්නව කියල කිවෙත් එයාලා මන් ගැන හිත හිත ඇවිලෙන බව දන්න හින්දමයි.

කකුල සනීප වෙනකම්ම සතියක් විතරම මට කිසිම දෙයක් කරන්න දුන්නේ නෑ ඔහු. ඇහුන විදියට නම් වෙඩින් එක හින්ද සති 2ක් නිවාඩු එයාට.. උදේට එයා කෑම මොනවා හරි හදනව මට අමාරු හින්ද.. හැමදම ත් වගේ උදේ 10 ට විතර ගෙදරින් ගියාම දවල්ට මට කන්න කෑම අරන් එනවා.. රෑටත් එහෙමයි.. ඒත් මේ සතියටම එක බත් කටක්වත් මේ ගේ ඇතුලේදි කනවා මන් දැක්කේ නෑ. එලියෙන් කාලා ආවා කියල තමයි අහද්දි කියන්නේ..වෙන්නත් ඇති මොකෑ සතියෙම නොකා ඉන්නව කියල ඈ.. අනේ මන්ද කොහොමත් අමුතු මනුස්සයෙක් නේ කියල හිත හදන් උන්නු මන් ඒ දේවල් ගැන මොකුත්ම අහන්න ගියේ නෑ.

දැන් නම් මට ඇවිදින්න පුළුවන් රිදෙන් නෑ. දවසක් උදේක හා හා පුරා කියල ඇදෙන් බැහැල පල්ලහැට යන්න හැදුවා විතරයි.

"තමුන් තමුන්ට අයිති තැන් වල විතරක් ගියොත් තමයි හොද. අයි මීන් මේ රූම් එක.. කිචන් එක.. සාලේ.. ගාඩින් එක. ඊට එහා මේ ගෙදර කිසිම කාමරේකට ගිහින් මට අහු වෙන්න එපා.. කලින් එක කකුලනේ.. ගිහින් තිබුනොත් කකුල් දෙකම කඩල ඇදක දලා තියනවා.."

එහෙම කිවයින් නම් මට ඒ කාමර වලට යන්නම ඕනා කියල හිතේ ඇඳිලා ඉවරයි.. මොකද මටත් ඕනිම උනේ මේ මනුස්සයා ගේ මේ හැසිරීම් වලට හේතුව දැනගන්න.. මට මෙහෙම කරන හේතුව දැන ගන්න.. ඒ කෝම උනත් ඒ කිව දේටත් ඔලුව වනල මන් ආවේ පල්ලහැට උදේට කෑම හදන්නයි..

දවස ඔහේ ගෙවිලා ගියේ සාමාන්‍ය ලෙසමයි.. රෑ වෙන්න ටිකක් ඔන්න මෙන්න තියලා ඔහු ගියේ වෙනදා වගේම කාර් එකත් අරන්.. සාලෙට වෙලා ටීවී එක බල බල උන්නෙ පාලුවටමයි. පැය 2කින් 3කින් විතර ආවේ නම් ගිය විදියට නෙමේ.. හොදටම නැතත් තරමක් ඩ්‍රින්ක්ස් අරන් බාගයක් ඉවර කරපු වයිට් ඇරැක් බෝතලයක්ද අතැතිව. ඇන තියාම දැක්ක හින්ද ක්ෂනික ටීවී එක ඕෆ් කරලා කාමරයට දුවන්න හැදුවත්,

"නැවතියන්"

කිව්වායින් තිබ්බ පයත් ආපහු අරගෙන එක තැන ගල් උනේ දැනුනු බියටමයි..

"උඹ මොකක්ද කර කර උන්නු හොර වැඩේ.."

"ආහ්.."

"මාව දැක්ක ගමන් දුවන්න තරම්..උඹ මොකක්ද කර කර උන්නු හොර වැඩේ.."

"ම න්.. මො..කුත් ක...රේ නෑ.. "

"ඇත්ත කියපන්"

"ම...න් ඇ..ත්ත කියන්..නේ "

"ඇත්ත එලියට ගන්න බේත් ඕනා වෙනවා නේද.."

ඒ ක්ෂණයෙන් ඇදන් උන්නු ට්‍රවුසර් එකෙහි වූ බෙල්ට් එක ඇදල ගත්තේ මාව ගැහෙන්න ගද්දි.. එදා පාරවල් මතක් වෙලා.. ගහන්න කලින්ම ඇඬුම් ආවත් ඔහුට ගානක් නෑ.. 1,2,3,4 පාරවල් 10 ක් විතර ගහල නැවැත්තුවේ මගේ ඇඬුම් විලාප මුලු ගෙදරම දෙවනක් වෙද්දි වගේම වේදනාව ඉවසගන්න බැරි තැන ක්ලාන්ත වෙලා ඇදගෙන වැටෙද්දි...

ඇහැරෙද්දි කලින්ද වගේම ඔහුම පාරපු තලපු ඒ අත පය අත ගානවා.. තේරෙන් නෑ මොකක්ද මේ වෙන්නේ කියන්න.. තේරෙන් නෑ මොකක්ද මන් කර ගත්තේ කියන්න.. තේරෙන් නෑ කොහෙන් මෙවා නවතීද කියන්න..

එදා ඉඳන් සතියකට දෙතුන් පාරක් ඔය දේ උනා.. සති මාස ගනන් ගෙවෙද්දි අම්මා අප්පච්චිලට නෑදෑයන්ට යාලුවන්ට පේන්න අපි දෙන්නා රගපෑමක් විතරක්ම කරද්දි.. ඔහු පොරොන්දු උනා වගේම ඒක රඟපෑමක් විතරක්ම උනා. එතනින් එහාට දෙයක් අපිට තිබුන් නෑ... විටින් විට අම්මලා අප්පච්චිලව ධීර් ගේ අම්මිලා ඉන්නගෙවල් වල යද්දි විටෙක ඔවුන් සුභ ආරංචි ගැනද අහනවා. සුභ අසුභ ගැන මන් විතරක්ම වෙන්නැති දන්නේ.. ඒ අහන වෙලාවට දුකක් නැතුවමත්

නෙමේ.. කෙල්ලෙක් චූටි කාලෙ ඉඳන් දකින හීනයක් ලස්සනට වෙඩින් එකක් අරන් ආදරේ කරනකෙනත් එක්ක ජීවිතේ විඳින්න.. එයාගේ පැටවුන්ගේ අම්මා වෙන්න.. ඒ උතුම් මව් පදවිය ලබන්න.. මට ඒ හැමදේම හීනයක්...

අදට හරියටම මාස තුනයි මන් මේ ගෙදර ට ඇවිත්.. උදේන්ම ඔහු කොහෙද ගියා.. උදේන්ම නා ගන්න හිතිලා.. වොශ් රූම් එකට වැදුනේ ඇඳුම් ද රැගෙනයි.. ඇඳුම් සියල්ල උනා දලා කැඩපතින් පේන මගේ නිරුවත් කය දිහා බලන් උන්නේ.. ඊයේ රෑ වැදුනු පාරවල්, කලින් දවස් වල ඒව රතු වෙලා ඉදිමිලා.. සමහර තැන් කලු වෙලා නිල් වෙලා.. සමහර දට නැගිටගන්න බැරි තරමට මට අමාරුයි.. අඩිය තියන්න බැරි තරමට වේදනයි.. කොන්ද දෙසින් විටින් විට එන වේදනාව දැන් ටික ටික වැඩී... හරි දුකයි මට මන් ගැනම.. තවත් බෑ මට මේ දේවල් දරන් ඉන්න.. මට හයියක් නෑ ඒ ශක්තිමත් ශරීරයෙන් වදින පාරවල් දරන් ඉන්න..

## 6 කොටස

විනාඩියට දෙකට ඇග තෙමාගෙන ටවල් එක ඇදගෙන මන් ආවේ ඔහුගේ බඩු තිබුනු කබඩ් එක වෙතයි.. ගත්තේ මේ මුලු ගෙදරම කාමර වල වූ යතුරු කැරැල්ලයි.. මම මේ මාස 3 ටම නොගියපු හැම කාමරයකටම යන්න ඕනි උනා. එකින් එක පල්ලහැ තට්ටුවේ කාමර පිරික්සුවේ මන් නොගියපු කාමර තුනක් එහි උනා. ඒත් ඒවා නිකම්ම හිස් කාමර ඇදක් සහ කබඩ් එකක් විතරක්ම තිබුනු කාමර. පල්ලහැ තට්ටුවේ කාමර ඔක්කොගෙම කබඩ් පවා බැලුවේ මන් මට මේ සිද්දිය තේරුම් ගන්න පුළුවන් යම් දෙයක් කොහේ හරි තිබ්ලා හම්බෙයි කියන විශ්වාසෙන්මයි.

ඊළගට උඩ තට්ටුව.. අපේ කාමරේ හැරුනම තව කාමර දෙකක් තිබුනා.. වම් පැත්තේ එකේ දෙර ඇරල බැලුවම ඒක දැකපු ගමන් අඳුරගන්න මට වැඩිවෙලාවක් ගියේ නෑ... ඔව් ඒ තමයි මීට මාස ගානකට කලින් මාව මුලින්ම කලර් ලයිට් එක ලගදි කිඩ්නැප් කරල ගෙනාපු කාමරය.. ඒ කියන්නේ එදත් මන් ඉදලා තියෙන්නේ මේ ගෙදරමයි.. ඒත් ඒක මන් දන්නේ අදයි.

ඊළග කාමරය තිබුනේ දකුණු පැත්තේ.. ටිකක් අමුතු කාමරයක්.. යතුර දලා අගුල කරකවනවත් එක්කම වගේ ට්‍රීන් ට්‍රීන් ගාගෙන ඩෝර් බෙල් එක වැදුනේ මාව ගැස්සිලා යද්දි.. මේ වෙලාවේ අම්මිලා වත් ද දන් නැ නේ හිතල ඔය අතරේ ධීර්ත් ආවොතින් කියල හිතලා ඒ ක්ෂනයෙන් ආයෙම ලොක් කරල යතුරු කැරැල්ල තිබ්බ තැනින්ම තියල හනිකට පල්ලහැට බැස්සේ දෙර අරින්නයි..

"භාවී..."

"ආද්‍යා..."

ලස්සන හිනාවක් එක්ක ගෙට ගොඩ උනේ ආද්‍යා.. මට ආද්‍යව මුලින්ම හම්බවුනේ අපේ එන්ගේජ්මන්ට් එක දවසේ.. ධීර් ගේ කසින් කෙනෙක්. හරිම හොඳයි.. එදත් මාත් එක්ක ගොඩක් කතා කලා.. එන්ගේජ්මන්ට් එකට පස්සෙ අද තමයි ඔන්න හම්බුනේ..

"ඉතින් ඉතින් කෝ අයියා භාවී.."

"අයියා උදෙන්ම කොහෙද ගියානේ වස්තුවේ.. දන්නවනේ ඉතින් හැටි කියල යන් නැ නේ..හී හී"

"අපොයි මම් නොදන්නවද එයා ගැන නම්.. මාත් මේ ලගකට ආපු ගමන් ආවේ ඔයාව බලල යන්න කියල.."

"හී හී ඉතින් මොනා හරි බොමුද මිම් කූල් ඩ්‍රින්ක් එකක්"

"අනේ එපා හාවී මන් මේ දැන් එනගමන් තමයි කෑවේ.. දැන් බන්ඩ් ෆුල් හි හී.. ඔක්කොමත් හරි සෙකියුරිටි අන්කල්ගෙන් නෙ ගෙදර ට එන්න පර්මිශන් ගන්න වදින්න උනේ.."

"අයියෝ එයත් හාම්පුතාටම හරියට සෙකියුරිටි අනේ.. මන් එලියට යන්නෙත් හෙන ගේමක් දීලා තව කොහෙද.."

සෑහෙන්න කියෝලා කියෝලා.. හිතා උනේ කාලෙකින් මන් ඇත්තටම.. මාරම නිදහස් මගේ හිතට මේ ගෙවුනු විනාඩි ගාන.

"හාවී..."

"ම්ම්ම්"

"අයියා කියල තියේද ඔයාට තියුරි ගැන?"

"තියුරි කියන්නේ කවුද ආදූ"

"රියලි?"

"යා ශුවර්.. කවුද තියුරි කියන්නේ"

"තියුරි කියන්නේ ධීර් අයියගේ නංගි මෝඩියේ.. "

"අනේ.. මන් ඇත්තටම දන් නෑ ආදූ.. මට කියල ත් නැ නේ.."

"එයා නැති උනා හාවී.."

"දෙයියනේ.. ඒ මොනා වෙලාද.."

sinhalaebooks.com

"හ්ම්ම්.. ඒක අභිරහසක් භාවී.. ධීර් අයියා ඔය පෝස්ට් එක ගත්තෙම මහන්සි වෙලා ඕක විසඳන්න කියලමයි.. ඒත් තාමත් එයාට බැරි උනා.."

"ආහ්.. ඒක තමයි ආදූ.. ඒත්..."

"ඇයි ඒත්?"

"නෑ ආදූ.. තව මොනාද ඔයා දන්න විස්තර අනේ ප්ලීස් මට කියන්නකෝ.."

"මමත් වැඩි විස්තරයක් නම් දන්නේ නෑ.. ඒත් කොහොම හරි වෙලා තියෙන්නේ ඇක්සිඩන්ට් එකක්. කාර් එකකට.. ඒත් ඒක කරපු කෙනාව මෙයාලට හොයා ගන්න බැරි වෙලා.. අඩුම ගානේ නීතියෙන් වත් දඬුවම් දෙන්න බැරි වෙලා. ඇක්සිඩන්ට් එකෙන් තියුරි නැති උනා.. ඒත් කරපු මනුස්සයා තාමත් නිදැල්ලේ.. ".

හිස මත අකුණක් පිපිරුවා වගේ දැනුනත් ඒක නොපෙන්වාම මන් වචන ගැටගැහුවේ

"කවදද ආදූ ඕක වෙලා තියෙන්නේ.."

"හරියටම මීට අවුරුදු 3 කට කලින් දෙසැම්බර් මාසේ 23 වෙනිද.."

මුලු ලෝකෙම හිස මත කඩන් වැටුනාක් මෙන් දැනුනේ ඉහින් කනින් හැමතැනකින්ම මට දඩිය දද්දී.. අමාරුවෙන් වල දපු ඒ අතීතය.. ආයෙම උඩට එනවා.. දෙයියනේ එහෙනම් ඒකයි ධීර් මගෙන් මෙච්චර පලිගත්තේ.. දෙයියනේ..

"භාවී..."

මත් පියව් සිහියට ආවේ ආදූ කතා කරනකොටයි.

"ඕ ආදූ.."

"මොකෝ උනේ කෙල්ල.."

"මොකුත් නෑ ආදූ.."

"මොකුත් නැති වෙන්න බෑ.. ඔයා දන්නව නේද ඒ ඇක්සිඩන්ට් එක ගැන මොනවමම හරි මිමි"

"ආහ්..මිමි.. මන්.."

"මට බොරු කියන්න එපා හාවී.. ඔයා ඔය බය වෙලා ඉන්න විදිය දැක්කම ඒක පේනවා මිම්මි.. ධීර් අයියත් ඔයාවම මැරී කරන්න හේතුව ඒකයි.. මන් හරි නේද.."

මගේ ඇස් උඩ ගියේ ඒ කිව දේටයි.

"කෝමද ආදූ ඔයා ඔච්චර විස්තරයක් දන්නේ.."

"තියුරි කියන්නේ ධීර් ගේ නංගි වගේම මගේ බෙස්ට් ෆ්‍රෙන්ඩ් වස්තුවේ.. මමත් චූටි කාලේ ඉදන් හැදුනේ මෙහෙනේ.. මටත් ඕනි තියුරිගේ මර්ඩර් එකේ ඇත්ත නැත්ත දැනගන්න.."

දෙයියනේ මර්ඩර් කියල වචනේ ඇහුන ගමන් මන් මුලු ගේම දෙවනක් වෙන්න කෑ ගැහුවේ

"ඒක මර්ඩර් එකක් නෙමේ.. ඒක අත්වැරදීමක්" කියල යි.

ටිකක් වෙලා මන් දිහා බලන් ඉදපු ආදූ නැගිට්ටේ එලියට යන්නයි..

"මන් යනව භාවි.."

"එපා ඉන්න කතාව අහල යන්න.."

"බැ අද බෑ.. ටයිම් නෑ.. මන් එන්නම් නෙක්ස්ට් වීක් හරියටම මේ වෙලාවට.. "

"හ්ම්ම්" කියල ඇයට සමු දුන්නේ දවල්ට උයන්න බලන් කිචන් එකට වැදෙද්දි.. හිත හරි කලබලයි.. දැනන් උන්නේ නෑ ඒ ධීර්ගේ නංගි කියන්න.. දෙයියනේ ඒකයි මෙච්චර තරහා මාව දකිද්දි.. මතක් වෙනව ඇති එයාට නංගිව මාව දකිද්දි.. ඒත් ඇයි එයා ධීර්ගෙම නංගි උනේ දෙයියනේ.. අඩ අඩම දවල් කෑම එකත් හැදුවේ ධීර් ත් ටිකකින් ගෙදර එද්දි.. ඔහුට මගේ වෙනසක් පෙනුනා විය යුතුය.. ඒත් කිසිම දෙයක් ඇහුවේ නෑ.. මමත් පාඩුවේ උන්නා මිසක් කතා කරන්න ගියේ නෑ..

තවත් සතියක් ඔය විදියට ගෙවුනේ සාමාන්‍ය ලෙසමයි.මතකයි අද තමයි ආදූ එනව කීව දවස..හිතේ තියන් උන්නු ලොකු ප්ලෑන් එකක් එලියට දන්න නම් ඔක්කොටම කලින් මන් ගෙයින් එලියට පැනගන්න ඕනි.. ඒත් මෙයා අද ගෙදර.. හෙමිහිට අඩි තිබ්බේ ඒ දෙසටයි.

"ධීර්.."

හාවක් හූවක් නෑ.. බැල්කනියට වෙලා මොනාද ෆයිල්ස් වගයක් චෙක් කරනවා..

"මට අම්මිලව බලන්න යන්න ඕනි. ගිහින් එන්නද."

"යන්න පුළුවන්.."

"හ්ම්"

"මොකද හදිසියේ.."

"හදිසියක් නෑ ධීර් නිකම් මතක් උනා"

"ආහ් හා.. ගිහින් එනවා එහෙනම්.."

"හ්ම් ඔයා එන් නෑ නේ.."

"මන් ගෙදර නෑ කියනව ඇහුවොත්.."

"හ්ම්"

ඔය යන්න දුන්නු පර්මිශන් එක තව ටිකකින් නැති වෙයි කියල බයටම විනාඩියට දෙකට ඇදගෙන මන් ආවේ පල්ලහැට. සෙකියුරිටි අන්කල්ටත් කියල චූටි ගේට් එක එලියට ඇවිත් ඇවිදන් ගියේ හංදියේ ත්‍රී වීල් පාක් එකටයි.. මන් නිතරම ටවුමට, අම්මිලෑ ගෙදර , ධීර් ලෑ ගෙදර යන්න එන්න හුරු වෙලාම උන්නු මාම කෙනෙක් වීල් පාක් එකේ ඉන්නව.. එයත් එක්ක යන්න බයත් නෑ. ඉතින් වෙනදා වගේම ඒ මාමා එක්කම මන් ආවේ අපේ ගෙදර.

අම්මිට ඉතින් මාව දැක්කා කියන්නේ රජ මගුල් වගේ හිතේ ප්‍රශ්න 1000 ක් තියන් ආවත් මගේ ගෙදර ට ආවම මට හරි සනහයක්. ඒත් මන් ආවේ නිකම් නෙමේ වැඩකට.. අප්පච්චි අයියයි දෙන්නම ගෙදර නෑ.. අම්මි උයන්න යද්දි මන් කාමරෙන් බඩු වගයක් ගන්න තියෙනෝ කියල කිවත් එකෙන් පැන්නේ වෙන මොකටවත්ම නෙමේ අප්පච්චි ගේ ඔෆිස් රූම් එකට රිංගන්නයි.. පොඩි කාලේ ඉදන් ඒ රූම් එක අපිට තහනම්.. ඒත් මට ඕනි උනා එදා දෙසැම්බර් 23 උනේ මොකක්ද කියල දැනගන්න.. අප්පච්චි මේ දේවල් පොලිසියේ

තියන් නැති බව මන් හොදටම දන්නවා.. පැය බාගයක් ගියත් හොයා ගන්න හම්බුන් නැ මට.. අන්තිමටම මටත් මහන්සී.. කොහොම හරි ලොකර් එකක් අස්සෙ තිබ්ලා මන් හොයපු ෆයිල් එක මට හම්බුනා.. ඔව් ඒ තමයි එදා සිද්දියේ ඔක්කෝ.....ම විස්තරය සාක්ශි ලියකියවිලි ඔක්කොම තිබ්බ ෆයිල් එක.

අම්මිගේ ඇස් වහල මෙ ෆයිල් එක කොහොම ගෙනියන්නද මන්ද.. ඒ කෝම උනත් මට නිදහසේ මේ හැම දෙයක්ම බලන්නත් ඕනා.. ඒත් කොහොමද කරන්නේ.. ගෙදර නිදහසකුත් නැ අරෙහෙ නිදහසකුත් නැ.. උදව් කරන්න පුළුවන් එකම කෙනා විදියට මට එක පාර මතක් උනේ ආදූ ව මන් දන් නැ ආදූවම මතක් උනේ ඇයි කියන්න.. සමහර විට මේ හැමදෙයක් ගැනම එයා දන්න හින්ද වෙන්න ඇති. ඒත් ඉතින් ඒ පිස්සිව කන්ටැක් කරගන්න මට නම්බර් එකක්වත් ඉල්ල ගන්න බැරි උනානේ අප්පා.. ආයෙ හම්බුනා නම් ඉල්ලගන්නෝනි අනිවාර්යයෙන්..

කොහොම හරි අම්මගේ අතින්ම බත් ටිකකුත් කාලා වැඩ වගේකට එලියට ආවේ කියල ත් කියල.. කොහොම හරි ගෙනාපු බෑග් එකට අර ෆයිල්ස් දාගෙන හොරෙන්ම අරන් අම්මිට වැදල ඒම, වෙලාව බැලුවේ..10යි 15යි. මන් ධීර්ට කියල ආවෙත් එන්නේ හවස කියල යි. මේ ටික බලන්න නිදහස් තැනකට යන්නත් ඕනා.. අයියගේ කාර් එකත් නම් අද ගෙදර. අප්පච්චි ගේ එකේ වගේ ගිහින් තියෙන්නේ..

"අම්මී..."

"ම්ම්ම්"

"අම්මි මට බස් එකේ යන්න බැ අප්පා බිල් වගයක් දන්නත් තියේ. සුපර් මාකට් එකට යන්නත් තියේ.. අයියගේ එකේ ගිහින් ආවා නම් හරි නේද.. අව්වේ යන්න ගියාම එපා වෙනව අප්පා"

"කාර් එකේ ගිහින් එන්න පුතේ අයියගේ කාමරේ කී එක ඉන්නකෝ මන් ගෙනත් දෙන්න"

ටිකකින් අම්මටත් කතා කරල මන් එන්න ආවේ අයියගේ කාර් එකේ කෙල්ටන් පාක් එකට.. ඒක හරිම නිදහස්.. අපි ස්කූල් යන කාලේ ගොඩක් වෙලාවට මේකට එනව ක්ලාසස් ඉවර වෙලා නිදහසේ ඉන්න.. නෝට් එකක් ලියන්න, ස්ට්‍රෙස් යන්න, පාඩම් කරන්න මේක නිදහස් තැනක්.. වැඩිය සෙනගත් නැති.. ඉතින් පාක් එකට හරවලා ටිකට් අරගෙන වාහනෙත් පාක් කරල හැරෙද්දිම හිනා වේගන ආවේ ආදූ..

"කොහොමද යකූ මාව හොයා ගත්තේ..."

"මන් ගෙදර ගියා මෝඩියේ.."

"අප්පටසිරි ධීර් ගෙදර නේ.. මොකද කිව්වේ"

"ඔයා අම්මල බලන්න ගියා කිව්වා.. පස්සේ එහෙම්ම මාත් එන්න එද්දි තමා දැක්කේ මේ වාහනේ පාක් එකට හරවනවා.."

"ඔව් අප්පා මටත් ඔයාව මතක් උනා විතරයි.. මෙතනට ඕනි හිතිලා.. ඒත් කන්ටැක් කරගන්න අඩුම ඔයාගේ ෆෝන් නම්බර් එකවත් නෑ නේ ආදූ.. අද මතක් කරල මට දෙනෝ හොදේ.. හදිසියකට ගන්න.."

"හලි හලි මෝඩ්.. දැන් මේ මොකද පාක් එකට ආවේ.. පෙනුමෙන් නම් ලොකු වැඩකට වගේ මන් හරිනේ.."

"හුම්ම් හරි නම් තමා... යන්කෝ ඉස්සල්ලාම ටේබල් එකක් හොයාගමු.." කියල අපි අඩි තිබ්බේ ටේබල් එකක් හොයාගන්නයි. පාක් එකේ එක් කෙරවලකට වෙන්න තිබුනු ටේබල් එකක් මුලු පාක් එකම ලස්සනට පේනව.. වෙලාවත් බලල හරි ඉක්මනට මන් ෆයිල් එක ඕපන් කරේ කලබලයෙන්. ඉක්මනට අප්පච්චි එන්න කලින්

sinhalaebooks.com

මේකත් තියල ගෙදර යන්න ඕනි හින්දයි.. එකින් එක මන් චෙක් කරන ටිකට ආදුත් ඒ හැම දෙයක්ම දකිද්දි ආදු ගේ මූණ ටිකෙන් ටික වෙනස් උනේ දුකින් ද තරහින්ද කියන්න මන් දන් නෑ..

එක පාරටම......

## 7 කොටස

එක පාරටම ඇය අසුනෙන් නැගිට්ටේ හරිම ආවේගෙන්

"එතකොට තමුන් නෙමේද මේ මර්ඩර් එක කරේ.."

"පිස්සුද ආදූ... මේක මගේ අතින් නෙමේ උනේ ඒත්.."

"ඒත් මොකද ආහ්.."

"මේක මර්ඩර් එකක් නෙමේ ආදූ.. ප්ලීස් තේරුම් ගන්න මේක අත්වැරදීමක්.. මේක උනේ මගේ අයියා අතින් ඒත් ඒත් ඒක එයා හිතල කරපු දෙයක් නෙමේ.. මට මට ඕනි උනේ ඇත්ත ධීර් ට කියන්න.. මෙතන මෙතන තියෙනවා ඒ CCTV ෆුටේජස් පවා.. "

"එතකොට තමුන්ලා මේවා තමුන්ලගේ පොලිස් බලෙන් හැංගුවා එහෙමනේ.. මේ ඇත්ත විස්තර ඔක්කොම හැංගුවා.. මර්ඩර් එක ගැන විස්තර හෙව්වම පොලිසියේ ඒ කිසිම දෙයක් නෑ.. අන්තිමට මරපු එකෙක් නෑ.. "

"ආදූ කූල් ඩවුන් ප්ලීස්.. හැමෝම බලනව ආදූ.."

"කූල්...මොන කූල් ද.. තමුන්ගේ අයියට පාඩමක් උගන්නලයි මන් නවතින්නේ.."

ඇය ඒ ආවේගෙන්ම යන්න ගියේ මට කඳුලු වැක්කෙරෙද්දි.. දෙයියනේ මන් මොකක්ද මේ කරේ.. අප්පච්චි මාව මරලා දායි.. අයියගේ ජීවිතේ අනතුරේ දැම්මා කියල.. දෙයියනේ මන් මොකද කරන්නේ... කඳුලු හෝ ගාලා... කඳුලින්ම ඩොකියුමන්ට් ටිකත් අස් කරගෙන පුළුවන් උපරිම වේගෙන් පාගලා ධීර් ව හොයන් ගියේ ගෙදරටයි...

"ධීර්...."

"හා..වී.."

ඔහුත් දුවගෙන වගේ පල්ලහැට ආවේ මන් කෑ ගහන්නේ ඇයි බලන්නයි...

"ධීර්.... අනේ... මන් වදින්නම් ධීර්.. මගේ අයියට මොකුත් කරන්න එපා..."

"මොනා ගැනද කියවන්නේ හාවී... පිස්සු හැදිලද තමුන්ට..."

"අනේ පිස්සු නෙමේ ධීර්... අනේ මන් ඇත්ත කියන්නේ එන්නකෝ අනේ එන්නකෝ කාමරේට... මට ඔයාගේ ලැප් එක දෙන්නකෝ චුට්ටකට.." අතින් ඇදගෙන යන්න හැදුවත් අත ගසලා දාලා

"පිස්සුද ගෑණියේ මොකද මේ වෙලා තියෙන්නේ.."

මට පුළුවන් උපරිම යටි ගිරියෙන්

"ධීර් ඉශාක්‍ය මදුරප්පෙරුම SSP ප්ලීස් මන් කියන එක අහල ඉන්න.. කීවම එන්න.."

ඔහුටත් ගස්සගෙනම ඇස් දෙක ලොකු කරගෙන බර අඩි තියල මත් වැදුනේ අපේකාමරේට.. ලැප් එක ඔත්.. එහෙම්ම අප්පච්චි ගේ ඩොකියුමන්ට් ඇතුලේ තිබුනු පෙන් එකගහල ඔහුට පෙන්නුවේ.. ඔහුගේ ඇස් උඩ යද්දි.. වගේම මා එක්ක කේන්තියක් එද්දි... ඒකේ ප්ලේ වෙන්නේ ඇක්සිඩන්ට් එක වෙනකම් විතරයි... එතනින් එහාට අයියා කාර් එකෙන් බැහැල දුවන් යන ටික තියෙන්නේ ඊලග ෆුටේජ් එකේ..

"උඹගේ කෙයාලස් ඩ්‍රයිවින් පේනවද.. උඹ හින්ද මගේ රත්තරන් නංගි මැරුනා යකෝ මැරුනා.. උඹ හින්ද.. මන් ඔය සාක්ශි හොය හොය උන්නේ උඹව ජීවිතාන්තය දක්වාම හිරේට යවන්න.. ඒත් උඹලෑ මහ ලොකු අප්පච්චි ඒ ඔක්කොම යට ගැහුවා හැංගුවා.. කාටවත්ම හොයාගන්න බැරි වෙන්න.. දැන් ලැස්ති වෙයන්.. උඹම මේවා ගෙනත් දුන්නේ ඒකටනේ...."

බිත්තියකට තද කරගෙන ගෙල මිරිකගෙන ඔහු කේන්තියෙන් කෑ ගහන්නේ එලෙසයි.. ජීවිතාන්තය තෙක් හිරේ.. කියන වචනේ ඇහුනම මුලු ජීවිතේම කඩන් වැටුනා වගේ දැනුනේ.. අයියව මෙච්චර අවධානමක මන් දැම්මේ ඇයි දෙයියනේ.. හුස්ම ගන්න බැරිව කැස්සකුත් එද්දි.

අර රෞද මාරයා වැහුනු කටහඬට බාධාවක් වෙමින් මගේ මොබයිල් එක නාද උනේ එවෙලෙයි.. එසැනින් අත ඇතෑරියා.. කැහැ කැහැම කෝල් එක ආන්ස්වර් කරද්දි කෝල් එක අම්මිගෙන්

"අම්මි...."

"අනේ.......පුතේ......."

"අම්මි.... ඇයි අම්මි මේ අඬන්නේ..."

"අනේ.. ම....ගේ පු...තේ... අ...යියා"

"අනේ අම්මී අයියා ඇයි අම්මි..."

"අනේෂ්..." ගාගෙන කෝල් එක කට් උනේ... මන් ඒ ක්ශනයෙන් ධීර්වත් පැත්තකට කරගෙන ආයෙම පල්ලහැට දුවද්දි... 100 ටම පාගලා එන ගමන් හයි වේ එක පහු වෙද්දිම ඉස්සරහින් ආපු ලොරියක කාර් එක වැදුනේ... වීදුරු කුඩුවෙන වාහන දෙක හැප්පෙන සද්දේ කන් බීරි වෙන්න ඇහිලා ටිකෙන් ටික ඔලුවේ ඉදන් පහලට ගලන ලේ බිඳු වලින්ම මගේ ඇස් දෙක වැහිලා. මුලු ලෝකෙම අඳුරු වේගන යද්දි....

දෙයියනේ... මගේ භාවී... මන් මොකක්ද දෙයියනේ මේ කෙල්ලට මෙච්චර කල් කරපු අපරාදය.. එදා.. එදා කාර් එකේ ඉදල තියෙන්නේ භාවී නෙමේ. ශිට් ධීර් උබ මොකක්ද මේ කරපු වැඩේ.. අහිංසකී ව කොච්චර පිච්චෙන්න ඇතිද.. කෙල්ල දැනුත් කියන්න ආවේ ඒ දේ වෙන්න්න ඇති.. ආහ් අයියා ව බේරගන්න කිවේ ඒක ද එතකොට.. දෙයියනේ.. මගේ කෙල්ල... දැනුත් කෝල් එකක් ආවේ කාගෙන්ද කොහෙද ගියේ ශිට්... අනේ මැනික...

ඔව් මන් දුවගෙන භාවී ලගට එද්දි භාවිගේ කාර් එක ඇක්සිඩන්ට් වෙලා.. කාර් එක හොදටම ඩැමේජ්.. දැක්කෙ නෑ මන් කෙල්ලව.. එතන ඉන්න හැමෝම කිවේ එක ම එක දෙයයි.. ඒ කෙල්ල ජීවත් වෙන එකක් නෑ.. කියලයි... මන් එද්දි මගේ කෙල්ල අයි සී යූ එකේ පණ අදිනවා.. භානුකයා අනිත් අයි සී යූ එකේ පණ අදිනවා.. මන් දන් නෑ භානුක ඇක්සිඩන්ට් උනේ කොහොමද කියන්න..

අනේ මට සමාවෙයන් භාවී.. මන් පරක්කු උනා රත්තරනේ ඒ ෆුටේජස් ඔක්කොම බලන්න.. එකක් බලල මන් හදිසි උනා රත්තරන්... අනේ මාව දාල යන්නෙපා මැනික... මට එකම එක චාන්ස් එකක් දියන් මගේ රත්තරනේ.. දීපු දුක් ඔක්කොටම හරියන්න මට මෙච්චර ලොකු

දඬුවමක් දෙන්න එපා මගේ රත්තරන්..

මට පේන්න තිබුනේ මන් දැක්කේ එදා නංගි ඇක්සිඩන්ට් වෙච්ච් කාර් එක විතරයි.. උබලෑ අප්පච්චිට මග ඇරිලා තිබ්බ එකම පොයින්ට් එක ඒක.. ඒ අප්පච්චි මැකුවේ එතන සී සී ටී වී ෆුටේජස් විතරයි... එතනට කලින් එකේත් වාහනේ පේනව කියන්න අප්පච්චි ගනන් ගත්තේ නෑ.. ඒත් මන් හොයා ගත්තා ඇක්සිඩන්ට් එක කරපු වාහනේ.. පස්සේ හෙව්වා මන් මාසගානක්... වාහනේ අරන් තියෙන්නේ උබේ නමට.. ඒක වැඩි හරියක් ඩ්‍රයිව් කරන්නේ උඹ හාවී.. මගේ නංගිගේ ලස්සනම කාලේ උබ මේ විදියට උදුරගෙන සතුටින් ඉන්නව කියල හිතුවේ හාවී.. ඒක දැකල ඉන්න බැරි උනා මට අයියා කෙනෙක් විදියට.. මට සමාවෙයන් රත්තරන් උබට දුන්නු වද වලට..

උඹේ අම්මා අප්පච්චි මෙතන හුල්ලනව මැනික.. දරුවෝ දෙන්නම පණ අදිනවා කියලා මෙතන දෙවනක් කරනවා මැනික.. අනේ නැගිටපන් මගේ වස්තුව.. මට බෑ රත්තරන් කාටවත් වරදක් නොකරපු උබ මෙහෙම විඳේනව බලන්න.. මන් මන් කරපු ඒවා ගැන දැන් පිච්චෙන විදිය උබ දන් නෑ රත්තරන්.. මන් දන්නව උඹට බැරුව ඇති මැනික මට සමාව දෙන්න.. අනේ ඒත් නැගිටපන් මගේ රත්තරන්.. මට උඹව පේන්නෑ මැනික.. උබේ අහිංසක මූණ පේන් නෑ.. උඹට කොච්චර තුවාල ද කියලවත් මට පේන් නෑ රත්තරන්..

අයි සී යූ එක දිහා බලාගෙන අයි සී යූ එක ලග තියෙන පුංචි බුදු මැදුර දිහා බලාගෙන කෑ ගහල කියන්න බැරි කමට කවදාවත් කිසිම දෙයක් නොඉල්ලපු දෙයියෝ බුදුන්ගෙන් මන් අද ඉල්ලන්නේ උබේ ජීවිතය හාවී.. මම ධීර්..

"වී ආ වෙරි සොරි SSP ධීර්.."

"ඩොක්ටර් මගේ වයිෆ් ට.."

"අපිට තාම එයා ගැන විශ්වාසයක් තියන්න අමාරුයි ඩීර්..
අභ්‍යන්තරයේ ගොඩක් ඩැමේජ්.. ගොඩක් බ්ලීඩ්.. අපි පුළුවන් උපරිම
බ්ලීඩ් එක නතර කරා... දෙවියෝ අතේ තමයි දැන්.. ඒත්"

"ඇයි ඩොක්ටර් ඒත්.."

"ඒත් එක දෙයක් ශුවර් ඩීර්.. මෙච්චර අදුනන ඔයාගේ මූණ දිහා
බලන් කොහොමද කියන්නේ කියල කල්පනා කරේ.."

"අනේ.. මොකක්ද ඩොක්ටර්.."

"හාවී නේද නම.."

"ඔව් ඩොක්ටර්..."

"හාවිගේ ලක් එකකට හාවි ජීවත් උනත්.. එයාට කවදාවත් ඇවිදින්න
බැරි වෙයි ඩීර්.. ඒ තරමටම මසල්ස් බෝන්ස් ඩැමේජ්.."

"ආහ්..."

**අවසානයට පෙර කොටස**

මැශින් කීපයක එක එක හඬවල් මැද්දේ.. තරමක් ඇහැට අපහසු
ලයිට් ගොඩක් මැද්දේ.. ඇලිලා වගේ තිබුනු දෑස් පියන් විවර කරේ
මන් බලාපොරොත්තු නොවූ රුවක් මගේ ඉස්සරහ වෙද්දි...
බලාපොරොත්තු උනු අම්මා අප්පච්චි අයියගේ රුව එතන නොවීය..

"දෙයියනේ...හාවී... මැනික... ඩොක්ටර්... ඩොක්ටර්.... නර්ස්.... මගේ වයිෆ්"

සිනා මුසු මුහුණු වලින් හනි හනිකට ඩොක්ටර් කෙනෙක් එක්ක නර්ස් ලා වගයක් වට උනේ ඔහු තරමක් ඈතට වෙද්දි.. අමුතු දෙයක් නෙමෙයි මේක.. කොහොමත් පිට අය ඉස්සරහ ඔහුගේ රගපෑම අලුත් දෙයක් නෙමේ මට.. තව මිනිත්තු ගානක් පුරාවට මොනාදෝ චෙක් කරලා අරයටත් මොනාදෝ කියල මොනාද බේත් වගේකුයි සේලයින් එකට විදලා ඔවුන් ඉවත් උනේ.. මාව මහත්සි කරවන්න එපා කියලයි.. ඒ හනිකට ඔහු දිව ආවේ මන් ලගට අඩියට දෙකට.. බැන්ඩේජ් කරපු ඔලුව අත ගාලා කිසිවක් නොකියම ඒ දෙතොල් තද කරේ දැනෙන නොදැනෙන ගානට නළල මතට.. ලැබුනු පලමු හාදුව.. කුළුදුල් හාදුව.. කිසිත් නොකියම ඒ රුව දිහා බලන් උන්නේ.. කවුරුත් නැති තැනත් ඇයි මෙහෙම රගපාන්නේ බලන්නයි.. මගේ මුලු සිරුර දිහාම බලලා ලොකු බර සුසුමක්ක් හෙලලා.. ඔහු ඉවත බලාගත්තේ මන් ඕනෑකමින්ම ඒ මූණ දිහා බලද්දි..

"ධී.....ර්...."

"ම්ම්"

මගාරිනවා මගේ ඇස්... ඒත් මොකද ඒ... දන්නව ලෙඩින් ඉද්දි අතක් වත් තියන් නැති බව ඒ හින්දම

"ධී....ර්..... බ...ල..න්..න..කෝ"

මන් කියපු දෙයක් කිව සැනින් ඇහුව පලවෙනි වතාව.. හැරෙන ගමන් ඔහුගේම පිටිඅල්ලෙන් ඒ ක්ශනයෙන් ඇස් වලට උනපු කඳුලු බිඳු කීපයක් පිස දැම්මේ මට නොපෙන්න්න උනත්.. ඕනෑකමින් බලන් උන්නු මම් ඒක දැක්කා..

"ඇයි.. මේ.. ක..ඳුලු..."

"පිස්සුද මිම්මි"

"මට..ද.. පිස්සු... මිම්.."

"භාවී.. මට සමාවෙයන් රත්තරන්.. මන් උඹට කොච්චර නම් රිද්දුවද... මන් එහෙම කරේ උඹ නොකරපු වැරැද්දකට.. අද උඹ මෙතන මෙහෙම දුක් විදින්නෙත් නොකරපු වැරැද්දකට... කොටින්ම උඹට මෙහෙම උනේ මන් හින්ද... මට සමාව දෙන්න පුළුවන් ද භාවි.. මට එකම එක චාන්ස් එකක් දියන් මැනික... එකම එක චාන්ස් එකක්... මන් රිද්දපු සේරම උඹ තනියම විඳගත්තා මැනික.. අම්මා අප්පච්චි අයියා යාලුවෝ ඒ කාටවත්ම නොකියා උඹ තනියම දරා ගත්තා.. ඒ දරාගෙනත් මන් වෙනුවෙන් කොච්චර දේවල් කරාද උඹ වයිෆ් කෙනෙක් විදියට.. මන් ඒ හැමදේම දැක්කා මැනික මන් ඒ හැමදේම දැක්කා.. මන් කොච්චර ගෙදරින් කන් නෑ කියල දැන ගත්තත් උඹ හැමදම මටත් එක්කම කෑම මේසෙට යවනවා.. හැමදම මන් එයි කියල බලන් ඉන්නවා.. කොච්චර රෑ වෙලා ආවත් මන් ආවමයි උඹ කන්නේ.. ඇවිල්ලත් උඹ දන්නව උබට අදත් වෙන්නෙම ගුටි කන්න කියල.. ඒත් උඹ බලන් උන්නා මැනික..

මන් ලගට නොආවට දුරින් ඉදන් හැමදේම ඉවසගෙන උඹ මගේ වැඩ හැමදෙයක්ම කරා මැනික.. දැනිල තියෙනව මේ මාස 3 ට තුන් හතර සැරයක්ම.. ඩියුටි ගිහින් නිදිමරල වැස්සට තෙමිලා කරල උණ හදන් ආපු දවස් වල.. මට නින්ද යනකම් ඉදල බයෙන් බයේ උණ බලනවා.. බාම් ගානවා.. මන් මන් ඒ ඔක්කොම දන්නව මගේ වස්තුව.. ඒත් ඒ ඔක්කොම යට උනා මගේ රත්තරන් ඔයාගේ වයසේ ඉන්න ඕනි මගෙම නංගි මගෙන් ඈත් කරේ උඹ කියල මතක් වෙද්දි... උඹ සතුටින් ඉන්නව මට බලන් ඉන්න බැරි උනා.. උඹ හිනා වෙලා ඉන්නව මට බලන් ඉන්න බැරි උනා.. මට සමාවෙයන් මගේ රත්තරන්.. නෑ

සමාව ඕන් නෑ මැනික.. මට ඉන්න දියන්.. ඔය ඇස් ලගින්.. ඒ හැමදෙයකටම හරියන්න ඊටත් වඩා ඊටත් වඩා සිය දහස් ගුණයක් වැඩියෙන් ආදරේ දෙන්නම් වස්තුව.. මගෙන් ඈතට දුවන් නැතුව ඉන්නවද මන් ලගින්න්.. මට ඉන්න දෙනවද ඔයා ලගින්.."

කවදාවත් අහන්න ලැබෙයි කියල නොහිතපු වචන ටිකක් කවමදාවත් අහන්න ලැබෙයි කියල නොහිතපු වචන ටිකක්.. ඒත් ඒවට මොනා කියන්න ද කියල හිතා ගන්න බැරුව මන් බලන් උන්නේ ඒ රුව දිහායි.. ඔව් ඔහු ඇත්ත දැනගන්නට ඇති.. ඒත් මට රිද්දපුවට පසුතැවිල්ලක් දුකක් මිසක් මගේ අයියා ගැන තරහක් ඒ ඇස් වල තිබ්බේ නෑ. ඒ හින්දම

"ම..ගේ.. අ..යි..යා කෝ.. "

"අයියාත් අයි සී යූ මැනික.."

"අ..යි..ය..ට මොක..ද උනේ.."

"අයියත් ඇක්සිඩන්ට් උනා මැනික.."

"අ..යියා කොහොම..ද ඇක්..සි..ඩන්ට් උනේ.."

"අනේ දන් නෑ මගේ රත්තරන්.. මට තාම ඒ වැඩ වලට යන්න බැරි උනා මැනික.. මන් හිටියේ මෙතන.."

"අයි..යාව බ..ල..න්.න ඕ..නි"

"ඉක්මනට සනීප වෙන්නකෝ මැනික.. අයියව බලමු හොඳද.."

"මට.. දැන්.. බ..ලන්න ඕ..නි ධී..ර්.."

"හ්ම් ඉන්නකෝ මැනික එහෙනම්..."

ඔහු එළියට ගියේ ඩොක්ටර් ව හම්බෙන්න විය යුතුයි. තාමත් මගේ හිත මගෙන්ම අහන ප්‍රශ්නය අම්මි අප්පච්චි ඇයි තාමත් මාව බලන්න නාවේ කියල යි.. මිනිත්තු 30 ක් විතර ගියත් තාමත් ඔහු නෑ.. හිතට බයයි.. තවත් මිනිත්තු 10 ක් යන්නට මත්තෙන් නර්ස් කෙනෙක් ඇතුලට ආවේ මගේ මොනාදෝ රිපෝට්ස් වගයක් අරගෙනයි තවත් මොනාද මන්ද චෙක් කරන්නයි..

"එක්ස්.. කියුස් මී.."

මගේ වචන ඇහුන සැනින් මන් ලගට ආවේ ඇය හරිම කරුණාවෙන්..

"මගේ හස්බන්ඩ් ඩොක්ටර් මීට් වෙන්න ගියා. තාම නෑනේ.."

"එස් එස් පී සර් නේද මිස්.."

"ම්ම් ඔව්"

"අනිත් අයි සි යූ එකේ හිටපු පේශන් නැති උනා මිස්.. ඩොක්ටර් ඉන්නේ එතන.. මන් හිතන්නේ එස් එස් පී සර් ගියෙත් එතනට...".

අයියත් ICU ඉන්නේ ධීර් කිව එක මතක් වෙලා හීන් දාඩිය දැම්මේ කටහඩ පවා වෙව්ලද්දි..

"අ..නේ මිස්.. ඒ පේශන්ගේ නම දන්නවද.. අනේ එයා මොනා වෙලාද ගෙනාවේ කවද්ද ගෙනාවෙ අනේ"

"කූල් ඩවුන් මිස්.. මිස්ට තාම හොද නෑ.. රිලැක්ස් වෙන්න.. තුවාල ඔක්කොම තාම අමුයි.. මැහුම් පෑරෙන්න පුළුවන්.. ප්ලීස් කම් ඩවුන්.."

ටිකක් සැරට ඒ වචන ටික කිවේ මාව කන්ට්‍රෝල් කරගන්න විය යුතුයි.

"මන් එච්චර විස්තරයක් දන් නෑ මිස්..." කියල ඇය මගෙ ඇස් මගෑරලා යන්න ගියේ.. කිසිත් නොකියා මන් ඉවත බලාගනිද්දි..

සෑහෙන වෙලාවකට පස්සේ

"වස්තු...ඇහැරුනාද මිම්මි"

"එක්කන් යන්නද ආවේ අයියව බලන්න.. මන් බලන් හිටියා ගොඩක් වෙලා. අම්මි අප්පච්චි කෝ ඇයි එයාල මාව බලන්න තාම ආවේ නැත්තේ.."

ඒ මුවේ නෑ උත්තර.. කලබල වූ සේයාවක් දිස් වෙද්දි ඕනෑකමින් මන් ඒ මූණ දිහා බැලුවේ මොකක්ද මේකේ තේරුම කියල අහන්නයි...

"වස්තුවේ මැතික නිදියන් ඉන්න අතරේ අම්මි අප්පච්චි දෙන්නම ඇවිත් බලල ගියේ.. අර බලන්න.. කෑම ජාති ගොඩක් දීලා ගියේ.... මැතික ලග මන් ඉන්නවනේ.. අයියා ලග කවුරුත් නෑ නේ.. කියල ඉක්මනට ගියා ඒ දෙන්නා අයියා ලගට.. ඉතින් ඒකයි වස්තුව ඒ දෙන්නා අයියා ලග ඉන්නේ.."

"ආ ඒමද කමක් නෑ ඒම නම්.. මාව එක්කන් යන්..නකෝ... මටත් අයියා ලගින් ඉන්න ඕනානේ.."

"අනේ අහන්නකෝ මැතික.. මැතිකගේ තුවාල තාම හොදටම අමුයිනේ මැතික.. මැහුම් පෑරෙයි ලූ.. එතකොට ආයෙම සර්ජරීස් කරන්න වෙයි.. මැතික ආස නෑ නේද ආයෙම සර්ජරි කරනවට.. "

නෑ කියන්න ඔලුව දෙපසට වැනුවේ ඉබේම ඔහුගේ අත හරි පරිස්සමට මගේ ඔලුව අතගාද්දි..

"ඉතින් එහෙනම් අපි ඉවසමු නේද වස්තුව.. අයියා ලඟට යන්න තව ත්‍රී ඩේස් බලමුද අපි මිමි.."

"අනේ බෑ ධීර්.. මට බලන්න ඕනි අනේ මේම ඇඳ පිටින්ම උස්සන් යන්න බැරිද මාව.."

හිනාවක් ඒ මුවඟ..

"මොකෝ මට යෝධ බල යෝධ ශක්තිය තියේ කියල හිතුවද මිමි මේ මැශින් ඇඳවල් එක්ක උස්සන් යන්න.."

ඒක කිව විදියට නම් මටත් හිනාවක් ආවා...

"ඒම තෙමේ අප්පා තල්ලු කරන් යන්න.. මේම මේම.."

"අනේ මගේ රත්තරන්.. ඒම බෑනේ වස්තුව.. බනීවී මේ ඩොක්ටර්ස් ලා හොඳටම මට මිමි...ප්ලීස් ත්‍රී ඩේස්.."

"හ්මිමිමිමි.. බෑ ත්‍රී ඩේස්.."

"මිමි එහෙනම් ටූ ඩේස්.."

"මට අදම යන්න ඕනි ධීර්"

"අප්පාහ්..මිමි අපි අහල බලමුකෝ හොඳද ඩොක්ටර් ගෙන්.. දැන් කියන්නකෝ මොනාද මැනිකට කන්න ඕනි කියල.. ගොඩක් කෑම ජාති තියෙනවා.. ඩොක්ටර් ත් කිවා.. හොදට කන්න දෙන්න කියල හොදේ.. වීක් ලූ ඔයා ඔන්න.. "

"ධීර්..."

"මැනික.."

"ඔයා කිවේ බොරු කියල මත් දත්තව ධීර්.."

"මොනාද.. වස්තු ඔයා දන්නේ.."

"අම්මිම් අප්පච්චි මාව බලන්න ආවේ නෑ ධීර්.. ඒ වගේම මත් දත්තව මට ආයේම කවදවත් ඇවිදින්න බෑ කියල.."

"ආහ්.. කවුද භාවී එහෙම කිවේ.."

"අම්මි අප්පච්චි නෙමේ ධීර් ආවේ ඩොක්ටර් තේ.. මත් නිදියත් නෙමේ උන්නේ එයා කීව ඔක්කොම මට ඇහුනා ධීර්.."

"එහෙම නෑ භාවී.. එහෙම නෑ.. එහෙම වෙන්න බෑ.. ඔයාට දැන්ම ඇවිදින්න බැරි උනාට.. විශ්වාසයි මට ඇවිදින්න පුළුවන් ඔයා ට හොඳ උනාම... ඩොක්ටර් ත් කිව්වා එහෙම වෙන්න පුළුවන් කියල.. ඔය විකාර හිතන් නැතුව සනීප වෙන්න භාවී.."

"ඩොක්ටර් කිවේ වෙන්න පුළුවන් කියල මිසක් පුළුවන් කියල නෙමේ ධීර්..."

"භාවී මාව කේන්ති ගස්සන් නැතුව ඉන්නවද.. ආ.."

"මත් කියන්නේ ඇත්ත ධීර්.. ඔයා කවද වෙනකම් කියල මාව බලන්නද.. ඇවිදගන්න බැරිව ඉද්දි.. මත් ඒකයි අම්මි අප්පච්චිවම අහන්නේ.. මට එයාලා ලගට යන්න දෙන්න ධීර්"

"ඇයි තමුන් දැන් එහෙම කියන්නේ.."

"මන් ඇයි මෙහෙම කියන්නේ කියන එකට උත්තරේ ඔයා ලගම තියෙනව ධීර්.. පටන් ගැන්මේ ඉදලම මේක ඩ්‍රාමා එකක් විතරයි.. අනික දැන් මන් මේ අබ්බගාථයෙක් උනාට පස්සේ ඔයාට මන් ගැන ආදරේ හිතිලලු.. ඒකේ කිසි තේරුමක් නෑ ධීර්.. මන් දැක්කා ඔයාගේ කබඩ් එකේ ඩිවෝස් පේපර්ස් ඕල් රෙඩි කරල තියෙනවා.. ආයෙම හොස්පිට්ල් එද්දි ඒ ටික අරන් එන්න.. අත් දෙකත් පණ නැතුව යන්න කලින් මට සයින් කරන්න.. "

"හාවී.. නවත්තපන්.. උඹ දැන් මගේ වීක් පොයින්ට් එක අල්ලගෙන ඒකම අල්ලල රිද්දවනවා.. මන් පිලිගන්නවා මන් උඹව මැරි කරේ උඹට රිද්දලා රිද්දලා අතාරින්න තමයි.. ඒත් මට හිත දුන් නෑ.. කේන්තියට මන් උබට පාරවල් 10,15 ගහල ගහල අන්තිමට උබට මගේ පාරවල් දරා ගන්න බැරුව මගේ අත උඩටම වැටෙද්දි.. මාව පිච්චුනා රත්තරන්.. උඹ රෑ කෙඳිරි ගාද්දි... මන් එලිවෙනකම් උඹට රිද්දපු තැන් බාම් ගාල අත ගගා උන්නා... මන් පිලිගන්නව මන් සතෙක් තිරිසනෙක් වගේ උබට රිද්දුවා.. ඒත් මට දැන් වැරැද්ද තේරෙනව මැනික.. අනේ උඹට පිං සිද්ද වෙයි මැනික.. මට ඉන්න දීපන් ඒ හැම වැරැද්දක් ම හරි ගස්සවන්න.."

"ඔයාට පිස්සුද ධීර්.. කලින් උන්නු මන් කෙසේ වෙතත් දැන් ඉන්නේ ඇවිදගන්න බැරිව..."

"නවත්තපන්..." මහ සද්දෙට දෙගුරුම් දෙන්න කෑ ගහල ඔහු යන්න ගියේ රූම් එකෙන් එලියට.... එසැනින්ම වගේ.. දෙරෙන් ඇතුලු උනේ.. ආදූ...

"හාවී..."

"ආදූ..."

"අයිම් සොරි හාවී.. ඔයාට උනු දේට.."

"ඒකට ඔයා මොනා කරන්නද ආදු..."

"තව දේකට සොරි භාවී..."

"මොකටද ආදූ..."

"ඔයාගේ අයියා නැති වුන එකට..."

"මො..කක්..ද... දෙයියනෙ.... "

මට පුළුවන් උපරිම හයියෙන් යටි ගිරියෙන් මන් කෑ ගැහුවේ දැත් වලට හයි කර තිබුනු උපකරණ ඔක්කොම වගේ ගැලවිලා.. සමහර දේවල් වැටිලා බිදිලා යද්දි... ඒ ක්ෂණයෙන් ධීර් දුවගෙන ආවේ බයෙන් වගෙයි.. නර්ස් ලා ඩොක්ටර් ස් ලා ආයෙම වට වෙද්දි.. මගේ ශරීරයේ වේදනාව දෙගුණ තෙගුණ වෙලා මටම දැනෙද්දි.. මන් කෑ ගහල ඇඩුවේ අයියව බලන්න එක්කන් යන්න කියල යි.. මාව කන්ට්‍රෝල් කරගන්න බැරිම තැන.. ඇඳත් එක්කම සේලයින් බෝතල් එක්කම ඇද රූම් එකෙන් එලියට ඇදන් ගියේ ධිර් වගේම තව නර්ස් ලා දෙන්නෙකුගෙත් උදව්වෙන්.. ධීර් හොඳටම බය වෙලා.. කීවත් වගේම ඒ රෝහලේ ඒ තට්ටුවේ තිබුනු අතිත් අයි සී යූ එක ලගට යද්දි.. අම්මි අප්පච්චි හතිකට දුවන් ආවේ.. මගේ ඇද ලගටයි.. සිහියක් නෑ මට. මේ හැමෝම කියන්නේ බොරු මාව නවත්තන්න.. ඒ දෙන්නත් ඇද පස්සෙන්ම අඩාගෙනම දුවන් එද්දි.. අයි සී යූ එකේම කොනක නිහඬව වැතිරිලා ඉන්න සුදු රෙද්දකින් වසා තිබ්බ අයියගේ රුව එකවරම නර්ස් කෙනෙක් රෙද්ද ඉවත් කරල පෙන්වද්දියි.. ඒ රුව දැක්කම මට ඉවසුම් නැති උනේ දෙයියනේ මට වඩා සිය දහස් ගුණයක් වැඩියෙන් ඔහුට තුවාල වෙලා..

හොස්පිට්ල් එක දෙවනක් වෙන්න කෑ ගගහ ඇඩුවේ මන් ලඟටම නැවීගෙන ධීර්.. මන් එක්කම මාව අල්ලගෙනම ඔහුත් එක්ක ඒ දුක

බෙදගන්න මට හයියක් වේගන.. ඇදේදිම උනත් ඔහුට තුරුල් වෙලා ඇති වෙන්න ඇඬුවේ කොච්චර වෙලාවක් දැයි කියන්න මත් දන් නෑ..

මත් ඇස් අරිද්දි මත් උන්නේ ආයෙම මත් උන්නු කාමරේමයි.. ඒ ඇස් තත්ත්පරෙකටවත් මාව තනි කරල නෑ.. ආයෙම ආයෙම කඳුලු අලුත් උනේ ආයෙත් සැරයක් මත් කෑ ගහල අඩද්දි...

"ධීර්... ආදූ... ආදූ තමයි අයියව ඇක්සිඩන්ට් කරේ.. එයා.. එයා තරහින් ගියේ.. ධීර්.. ආදූ තමයි.. කලින් ඇවිත් මට සොරි කියලත් ගියා ධීර් ආදූ.. අයියා නැති උන එකට.. එයා සතුටුයි.. ධීර්.. අනේ එයා ඇයි ධීර් මගේ අයියට එහෙම කරේ.. ධීර් ඔයාවත් අයියට ඒම කරේ නැති එකේ ඇයි ඇයි ආදූ ඒම කරන්නේ ධීර්..."

මගේ මුවින් කියවෙන වචනයක් වචනයක් ගානේ ඔහු පුදුම උනේ ඇයි කියන්න මම් දන්නේ නෑ... ඒ ක්ශනයෙන්.......

**අවසන් කොටස**

"හාවී...මොනාද රත්තරනේ මේ කියවන්නේ.. මොන ආදූද මැනික කවුද ආදූ කියන්නේ"

කියන් ගිය වචන සියල්ල ගිලුනේ මට ඔහු ආදූ කවුරු කියල අහද්දියි..

"ආදූ ධීර් ආදූ.. ආදූෘ.. අර අපේ ගෙදර එන්නේ.. අනේ ඔයාලගේ කසින් අපේ එන්ගේජ්මන්ට් එකට ආවේ.. මට එයාව ඊට පස්සේ දවස් දෙක තුනක්ම හම්බුනා. එයත් මේ විස්තර ඔක්කොම දන්නවා ධීර්.. ඊයේ ඔයාව හොයන් අර ඩොකියුමන්ට් ටික පෙන්නන්න ගේන්න කලින්

මට ආදුව හම්බුනා.. එයත් මේ ඔක්කොම දැක්කා.. ඊට පස්සේ ඊට පස්සේ තරහින් ගියා ධීර්.. මටත් කෑ ගහලා අයියගෙන් පලි ගන්නව කියලා.. එයා එයා තමයි අයියට මේම කරේ ධීර් එයා තමයි."

ඔහු නිහඬයි වගේම බය වුනු මූණක් එක්ක පුදුමෙන් මන් දිහා බලන් ඉන්නවා.. ටිකකින් හනිකට සාක්කුවට අත දාලා මොබයිල් එක අරගෙන මොනවද්දෝ හෙව්වේ හරි කලබලේට.. ඔව් ආදුගේ ෆොටෝ එකක් මට පෙන්නුවේ ඒ දෑත් වෙව්ලනවා...

"මෙයාද ඔයාව හම්බෙන්න ආව ආදු මැනික.."

"ඔව් ධීර්.. මෙයා තමයි.. මෙයා තමයි ධීර්"

"දෙයියනේ" කියමින් ඔහු මා වැළඳ ගත්තේ කිසිත් නොකියායි..

"ඇයි ධීර්... එයා එයා නරකයිද ඔයා ඔයා එයාව පොලිසියට ගෙන්නලා ප්‍රශ්න කරනව නේද "

"මැනික.. අනේ වස්තුවේ මන් කොහොම කරන්නද මගේ රත්තරන් ඒක.."

"අනේ ඇයි ධීර්.."

"ඒ මගේ නංගි මැනික ඒ මගේ නංගි.. තියුරි ආද්‍යා.. ඒ මගේ නංගි රත්තරන්.. අවුරුදු 3 කට කලින් නැති උනු මගේ නංගි මැනික.."

කටේ කෙලත් හිඳිලා පපුව හිටින්න වගේ ආවේ මන් බය උනු පාරටයි..

"වෙන්න බෑ ධීර් එයා එයා අපේ එන්ගේජ්මන්ට් එකටත් ආවා අපේ ගෙදර ත් ආවා.. මාව හම්බෙන්නත් ආවා.. පාක් එකටත් ආවා..."

"අනේ මන් මොනාද වස්තුවේ මේවට කියන්නේ.. මන් දන් නෑ මැනික මොනව උනාද කියන්න.. ඒත් මට විශ්වාසයි ඔයා ඔය කියන්නේ නැති උන නංගි ගැන කියල.."

"නෑ නෑ ධීර්.. අපේ අපේ එන්ගේජ්මන්ට් එකේ ෆොටෝ ශූට් එක කරේ අර අර BloomingEye Photography ඒ ඒ අයගේ Fb පේජ් එකේ අපේ අපේ එන්ගේජ්මන්ට් එකේ ෆොටෝස් දල තිබ්බා නේද.. අනේ අනේ ඒවා ටික මට පෙන්නන්න කෝ.. මන් පෙන්නන්න ඔයාට.."

ඔහු කිසිත් නොකියා නිහඬවම මන් කිව එක කරේ මන් ෆොටෝස් 90 ගානකින් එකින් එක ෆොටෝස් බලද්දි.. ඒත් ඒ කිසිම ෆොටෝ එකක ඇය උන්නේ නෑ.. ඒ කිසිම එකක ඇය නෑ.. ඒත් විශ්වාසයි ඇය අපිත් එක්කම එන්ගේජ්මන්ට් එකේ උන්නා මම දැක්කා.. දෙයියනේ වෙන දේ තේරුම් ගන්න බැරුව මන් තදින්ම ඇස් පියා ගත්තේ ඔහු ආදරෙන් මාව වැළඳගනිද්දි..

"වස්තුව... වෙන්න තියෙන දේවල් වෙන එක අපිට නවත්තන්න බෑ මගේ වස්තුව.. මන් ඒක ඉගෙන ගත්තෙත් ඔයා දිහා බලලා.. අයියගේ ඇක්සිඩන්ට් එකේ විස්තර හෙව්වම සී සී ටී වී කැමෙරාස් වල තියෙන්නේ කාර් එක වේගෙන් ඇවිත් එක පැත්තකට ඇදිලා ගිහින් කලර් ලයිට් එකේ වදිනවා විතරයි වස්තුව.. හරියටම නංගි ඇක්සිඩන්ට් උනු තැනම.. අනේ මන් දන් නෑ මගේ රත්තරනේ මන් අසරණයි.. මන් මොනවා කියන්න ද කියල මට තේරෙන් නෑ මැනික..."

කිසිත් නොකියම මන් උන්නේ ඉවත බලාගෙන.. හවස මාව නෝර්මල් රූම් එකකට මාරු කරා.. ඒත් කා එක්කවත් එක වචනයක් වත් කතා කරගන්න පුළුවන් තත්ත්වෙක මන් උන්නේ නෑ මෙ උන දේවල් වල හැටියට..

sinhalaebooks.com

මට ගෙදර යන්න පුළුවන් උනේ 3 වෙනි දවසේ.. ඒකත් ටික වෙලාවකට විතරයි.. හොස්පිට්ල් එකෙන්ම ගෲප් එකක් එක්ක අයියගේ අවසන් කටයුතු වලට සහභාගි වෙන්න අවසර දුන්නා.. අඬලා අඬලා අඬලා හෙම්බත් වෙලා ලෙඩේ තවත් වැඩි උනා කීවොත් හරි.. පොඩි කාලේ ඉඳන් සෙල්ලම් කරලා දුවල පැනල රණ්ඩු වෙලා තරහ වෙලා යාලු වෙලා.. අප්පච්චි ගෙන් පස්සේ මන් වැඩියෙන්ම ලන් උනු පිරිමියා අප්පච්චි ට විතරක්ම දෙවෙනි උනු මගෙ දෙවෙනි අප්පච්චි.. පොඩි කාලේ ඉඳන් ඇහැක් වගේ පරිස්සම් කරපු මගේ අයියා.. මන් කොහොමද අයියේ බලන් ඉන්නේ.. මට ආයෙම දුක හිතුනම අයියේ කියල ලඟට දුවන් එන්න කවුද මගේ අයියේ ඉන්නේ.. අනේ මට දුවන් එන්න බෑ දෙයියනේ.. අනේ අයියා මන් ලඟ ඉන්නම ඕනි කාලේ .. මන් කෝමද අයියා මේවා දරා ගන්නේ.. අනේ මාවත් ඔයා ලඟට ගන්නකෝ.. අම්මි හොඳට ම අඬනව අයියා. එයා ඔයාව දකින දකින සැරේට ෆේන්ට් වෙනවා.. අප්පච්චි හැම තිස්සෙම පිටි අල්ලෙන් කඳුලු පිහ පිහ ඉන්නව අයියා.. ධීර් තමයි ඔක්කොම වැඩ බලන්නේ.. අනේ මගේ රත්තරන් අයියේ ඔයා දන්නවද ඒ අයියා අතින් ඇක්සිඩන්ට් වෙලා නැති වෙලා තියෙන්නේ ධීර්ගේ ම නංගි..මන් දන් නෑ සමහර විට මාව හම්බෙන්න ආවා වගේම එයා ඔයා ව හම්බෙන්නත් ආවද අයියේ.. අනේ නැගිටින්නකෝ මගේ අයියේ... අයියගේ ආදහන කටයුතු කරන වෙලේ නම් මම කී පාරක් ෆේන්ට් උනාද කියන්න මටත් මතක නෑ.. අන්තිමට උනේ අවසන් කටයුතු ඉවර වෙන්නත් කලින්ම මාව ආපහු හොස්පිට්ල් එකට රැගෙන ඒමයි..

දවස් ගානක් ඔහේ ගතවුනේ මන් කා එක්කවත් කතාවක් නොවෙද්දි... ටිකෙන් ටික තුවාල නම් හොඳ උනත් මගේ දෙපා නම් මට තේරෙන් නෑ.. අඩුම දනහිස් වලින් පල්ලහැ කිසිවක්ම මට දැනෙන්නේ නෑ.. අයියාගේ දවස් හතේම වැඩ අතරමග අම්මි අප්පච්චි පුලු පුලුවන් හැම වෙලේම හොස්පිට්ල් ආවා.. හරි ආදරෙන් හිනා වෙලා අවුරුදු ගානක් තිස්සේ උන්නු අපේ පුංචි පවුලට මොකක්ද මේ උනේ දෙයියනේ... දවසක් අම්මි එද්දි අයියාගේ ඩයරි එක මට ගෙනත් දුන්නා.. ඔව් ඔහු දැනන් ඉඳලා කවදම හරි ඔහු කරපු වැරැද්දට දෛවයෙන්

sinhalaebooks.com

ස්වභාවධර්මයෙන් ඔහුට දඬුවමක් ලැබෙන බව.. එදා ඔහු ඩ්‍රයිව් කරේ චුට්ටක් ඩ්‍රින්ක්ස් අරගෙන කියල ත් ඔහුම ලියල තියෙනවා.. ඒ වැරැද්ද ඔහුගේම බව ඔහුම ලියල තියෙනවා.. ධීර්ගේ නංගි කියන්න ඔහු ඒ කාලේ වෙද්දි නොදන්නව උනත්.. අවුරුදු 3 කට කලින් ඔහු අතින් ඒ විදියට නැති උනු ඒ ආදුගේ රුව ඔහු චිත්‍රයක් ඇදලා තියෙනවා ඒ ඩයරියේම.. ඔව් ඒ ඇයම තමයි..

ආදූ.. මම තරහ නෑ ආදූ...
ඔයාට අලුත් ආත්මයකට දැන් නිදහසේ යන්න පුළුවන් නේද ආදූ
මගේ අයියා එහෙම කරන්න ඇත්තේ හිතලා නෙමේ ආදූ
ඒත් කොහොම උනත් ඒක වැරැද්දක් බව දනිමි
සමාව ඉල්ලන්න බෑ ආදූ
කියන්නේ මොනවද කියන්න තේරෙන්නෙත් නෑ
නිවන ඔබට දුර බව දනිමි
සුන්දර ආත්මයක් ලැබෙන්න පතමි

භාවී.

වෙව්ලන දෑතින් මෙසේ සටහන් කර යලින් අම්මිට දුන්නෙමි. කාලය ඔහේ ගෙවී ගියේ මන් මුලුමනින්ම සුව අතට හැරෙද්දියි.. තවමත් දෙපා නම් දැනෙන් නෑ මට.. එදා පටන් අද වෙනකම්ම එක මොහොතකට වත් මාව තනි නොකරපු ධීර් කාටවත් නොකියම ඔහුගේ ජීවිතය ගැන ලොකු තීරණයක් අරගෙන.. මන් අදයි දැන ගත්තේ.. මන් තුන් හිතකින්වත් බලාපොරොත්තු නොවූ දෙයක්..

"අනේ වස්තුව.. මට සමාවෙන්නකෝ.."

"කතා කරන්න එපා ධීර්.."

sinhalaebooks.com

"මට ඒ ජොබ් එකත් එක්ක මැනික එක්ක මෙහෙම ඉන්න බෑ වස්තුව.. මන් ඒකනේ රිසයින් උනේ.."

ඔව් ඔහු ඔහුගේ පොලිස් ජීවිතයට සමු දීලා මන් ඇක්සිඩන්ට් උනු දවස් වල.. කාටවත් නොකියම.. මේ වෙනකම්ම හංගන් උන්නත් ඒ ඩොකියුමන්ට්ස් මගේ ඇහැ ගැටුනේ අහම්බෙන් රෝද පුටුවට වෙලා ඔහුගේ ටේබල් එක පිලිවෙලක් කරනකොට..

"ධීර්.. අම්මි අප්පච්චි දැන ගත්තොත් මොකද කරන්නේ කියන්නකෝ.."

"එයාල මොකුත් කියන් නෑ මැනික.. කෝමත් එයාල එච්චර කැමැත්තකින් නෙමේ උන්නේ මන් ඔය ජොබ් එක කරනවට.. මට දැන් ආයිම කම්පැනියේ වැඩ බැලුවැකිනේ මැනික අප්පච්චි එක්ක මිම්.."

"හ්ම්ම් අනේ මන්ද අප්පා.."

එසැනින් පරිස්සමින් රෝද පුටුවෙන් අරගෙන පරිස්සමට ද්‍රේනට අරගෙන පරිස්සමට ඇඳෙන් තිබ්බේ ඔහුත් ඇදට එද්දී.. ගෑවෙන නොගෑවෙන තරමට ලගට ඇවිත් ඇස් දිහා බලාගෙනම...

"පලවෙනි පාරට පලවෙනි පාරට එකම එක පාරක් මට ආදරෙයි කියන්න භාවී.."

කිසිත් නොකියා මන් කට කොනකින් හිනා උනේ එද එන්ගේජ්මන්ට් එකට ලෑස්ති වෙද්දී මගෙන් ගත්තු ප්‍රොමිස් එක මතක් වෙලයි...

"ඇයි මාව මරාගන්න ඕනිද.. දැන් මිම්.. පොරොන්දුව අමතකද?"

මගේ මුවින් පිටවුනේ එය පමණි.. මගේ වචන ඔහුගේ කන වැටෙද්දිම දුකින්ද තරහින්ද කියන්න දන්නේ නෑ ඔහු එසැනින් මගෙන් ඉවත් උනේ කිසිත් නොකියායි.. බර සුසුමක් හෙලලා මන් ඉවත බලාගත්තේ..

ඔහු බැල්කනියට යද්දි.. ටික වෙලාවකින් ආයෙම ඇවිත්

"ලෑස්ති වෙමු"

"ඇයි"

"අපිට මෙහෙම ජීවත් වෙන්න බෑ භාවී.. මන් මාස තුනක් තිස්සේ සතෙක් තිරිසනෙක්වගේ උබට රිද්දුවා.. ඒ මාස තුනම මන් උබට අමු අපායක් කරා... ඒක ඇත්ත.. මන් කරපු ඒ වැරැද්දේ බලපතලකම දඩුවමක් විදියටම දෙයියෝ මට දුන්නා.. ඒත් ඒම හරියන් නෑ.. මට ඕනා ඒ වැරැද්ද හරිගස්වන්න.. දැන් මන් මගේ පණටත් වගේ උබට ආදරෙයි.. මේවා මන් කොච්චර කියෙව්වත් තේරුමක් නෑ භාවී.. අද අපි මේ ඔක්කොම ඉවරයක් කරමු.. ඔයා අම්මිලා අප්පච්චිලා එක්ක ඉන්න.. අපි සෙපරේට් වෙමු.. ඩිවෝස් පේපර්ස් සයින් කරමු.. ලෑස්ති වෙන්න ගෙදර යන්.. ඔයාගේ බඩු ඔක්කොම හවස් වෙද්දි ගෙදර ට ලැබෙයි.. ඒ හින්දු ඒවා පැක් කරන්න හදිසි වෙන්න ඕනි නෑ.."

හිත අමුතුම විදියකට රිදුනත් කිසිත් නොහිතා හා කියන්න ඔළුව වනලා උන්නේ මාව පරිස්සමට ඇදෙන් ඉන්ද වද්දි.. ඇඳුම් අල්මාරිය ඇරලා ඔහු තෝර ගත්තේ කොළ පාට ගවුමක්. කර පිටුපසින් හීනි පටි ගිය හීනි පටි දෙකකින් කර ගැට ගහන්න තිබුනු නෝර්මල් ෆ්ලෙයාඩ් ගවුමක්ක්... තිබුන් නෑ මට එහෙම ගවුමක්.. ඔහු ගෙනාපු ගවුමක් විය යුතුයි.. කිසිත් නොකියා ඇඳුම අතට දීලා ඔහු වැදුනේ බාත් රූම් එකට.. ඇදන් උන්නු ටී ශර්ට් එක ගලවලා කොන්දෙන් නැවීගෙනම ඇදන් උන්නු කෙටි ශෝට් එකත් ගලවලා.. අන්ඩර් ස්කර්ට් එකත් ඇද ගත්තේ අමාරුවෙන්.. කොහොම හරි කරලා ගවුම ද ගත්තත් ගවුම ලස්සනට හදගන්න බෑ දෙපා වාරු නැතුව.. ඒකට ඉතින් මෙච්චර කල් උන්නා වගේම ඔහු එනකම් ඉන්න ඕනි.. මිනිත්තු 10 කින් විතර ඔහු ආවෙම මන් දිහා බලාගෙන.. ඒ හැඩි දැඩි සිරුරට වාරු කරගෙන මාව දෙපයින් නැගිට්ටවලා වැටෙන්න නොදී අල්ලගෙන ගවුම හරියට හදලා ආයෙම රෝද පුටුවෙන් ඉන්දෙව්වේ

වචනයක් වත් කතා නොකරයි.. හැමදම ඒ විදියට ඒ පපුවට වාරු කරගෙන එක විනාඩියකට හරි ඔහුගේ වාරුවෙන් හරි මාව දෙපයින් නැගිට්ටවන එකට.. ඒ මොහොතට ඒ මුලු පපුවම බදාගෙන ඉන්න මන් ආස කරා...

කර පිටුපසෙන් ගැට ගහන්න තියෙන හීනි පටි ටිකත් ලස්සනට පිලිවෙලට ගැටගහල ඔහුත් ඇඳුම් ද ගන්න ආයෙමත් බාත් රූම් එකට වැදුනේ මන් කොන්ඩෙත් පීරගෙන ඉන දක්වා දිගු කොණ්ඩය කඩලා.. චූටි කට්ටක් ගහල ලැස්ති වෙද්දි ටික වෙලාවකින් ඔහු ආවේ මොනාදෝ ඩොකියුමන්ට්ස් වගේකුත් අරගෙන මාවත් දෝතට ගන්න ගමන්..මට රෝද පුටු දෙකක් තිබුනා.. උඩ තට්ටුවට එකකුයි පල්ලහැ තට්ටුවට එකකුයි. නැත්නම් මාවත් උස්සන් එනව මදිවට පල්ලහැට බහින බහින පාරට ඔහුට රෝද පුටුවත් උස්සන් එන්න වෙනවා.. කොහොම හරි වාහනයටත් නග්ගගෙන මන් දිහත් බලල බරට සුසුමක් හෙලල ඩ්‍රයිව් කරන්න පටන් ගත්තේ..

පැය 2ක් විතර ගියාට පස්සේ.. ගෙදර ට යන අතරමග තිබුනු රෙස්ටොරන්ට් එකක් ලග නතර කරේ උදේට කමු කියල යි.. වෙලාව 10.30 යි. ඒක ලස්සන අවුට් ඩෝර් කන්න පුළුවන් රෙස්ටොරන්ට් එකක්.. රෙස්ටොරන්ට් එකක් කිවට ඒක ලොකුයි.. හොටෙල් එකක් වගේ.. ඇතුලත වගේම එලියේ ගාඩ්න් එකේ ඉදගෙනත් කෑවැකි. ඉතින් දෝතින්ම උස්සන් ගිහින් ගාඩ්න් එකේ තැනක් බලල මාව ඉන්දෙව්වේ එයත් පසෙකින් ඉද ගන්න ගමන්.

"මොනාද කන්නේ වස්තු.."

"මිම් මොනාහරි කමක් නෑ"

ලා හිනාවක් දලා ඔහු ඕඩර් කරේ ඉදිආප්ප.. මේ ගෙවුනු මාසෙට ඔහු දන්නවා මන් ආස දේවල්.. ඒ මුලු මාසෙම කෑම හැදුනේ ඔහුගේ අතින්.. අවුරුදු 3ට පස්සේ.. ආදු නැති උනත් හරි ඔහුගේ අම්මි

අප්පච්චි මේ ගෙදර ඉන්න බෑ කියල වෙන ගෙදරකට ගිහිම්. ඔවුන් දැන් ඉන්නේ ඒ ගෙදර.. එදා ඉඳන් එකදු බත් කටක් ඒ ගෙදරින් නොකාපු ධීර් ඒ මුලු මාසෙම ගෙදරින් කෑම කෑවා..

කෑම එකත් කාලා බිල් එක පේ කරන්න ඕනි කියල මතක් වෙද්දි එයාගේ වොලට් එක කාර් එකේ දල ඇවිත්... එයාට හැමතිස්සෙම අමතක වෙන දෙයක් තමා ඔය වොලට් එක.. කාර් එක පාක් කරල තිබ්බෙත් මෙතනට පේන දුරක.

"වස්තු ඔහොම ඉන්න මන් ඉක්මනට වොලට් එක අරන් එනකම්. පරිස්සමින් හොදේ.. දඟලන්නෙපා.." කියල ආදරෙන් කියල ඔහු ඇවිදන් ගියේ කාර් එක ලගට.. ඒත් කාර් එක ලගට යනවත් එක්කම වගේ කොහෙන්ද මන්ද ඉඳන් ආපු මිනිස්සු කීප දෙනෙක් ඔහුව වට කරගත්තේ මම දුරින් ඉඳන් බලන් ඉද්දි. යම් කතා බහකින් පස්සේ ධීර් එක්කෙනෙක්ගේ කොලර් එකකින් ඇදලා ගත්තේ අනිත් අය ඔක්කොම වටවෙලා ධීර් ට හොඳටම ගහන්න පටන් ගනිද්දි..

දෙයියනේ කවුද ඒ මිනිස්සු..

"ධීර්... අනේ කවුරුත් නැද්ද... ධීර්... අනේ ගහන්නෙපා... ධීර්.... යටි ගිරියෙන් කෑ ගැහුවත් රෙස්ටොරන්ට් එකේ උන්නු කිසිම කෙනෙක් ඒ පැත්තට ගියේ නෑ... එයා එයා හොඳටම ගුටි කනවා..

"දෙයියනේ ධීර්...කවුද උඹලා..." කෑ ගහල කෑ ගහල බැරිම තැන තවත් ඔහුට ගහනව පෙනෙද්දි පපුව කඩන් වැටෙන තරමේ වේදනාවක් දැනෙද්දි... කෑ ගහගෙනම දෙපා වලට දැනුනු මහා ලොකු වේදනාවත් කාගෙනම මන් ටේබල් එකත් අල්ලගෙනම දෙපා වලට වාරු දීලා නැගිට්ටත් ඇවිදන් යන්න පුළුවන් වෙයිද කියල ශුවර් එකක් තිබ්බේ නෑ... ඒත් බලන් ඉන්න බෑ..දෙයියනේ... මොන තරහක් පිරිමහනවද ඔවුන් ඔහුගෙන්... ඔහු බිම.. ඒත් ඔවුන් නවත්තන් නෑ ඔහුට රිද්දන එක දෙයියනේ..

"ධීර්......" පුළුවන් උපරිම හයියෙන් කෑ ගහලා ඒ දිහාවට දුවන්න හැදුවත් පලවෙනි දෙවෙනි තුන් වෙනි අඩි වෙව්ල වෙවුල හරි අපහසුවෙන් තිබුනත් හතර වෙනි අඩිය බරට තියන්න මට පුළුවන් උනා.. තුන් හතර පොලකම කන්ට්‍රෝල් නැතිව වැටෙන්න ගියත්.. අන්තිමට ඔහු ලගට දුවන් ගියේ අර කට්ටිය ඔක්කොම ඉවත් වෙද්දි... වැතිර සිටින ඔහුව වැළඳගන්න ගමන් මාවත් එතනම ඉන්දවුනේ දෙපා වලින් දැනෙන වේදනාවට වගේම නොනවතින වෙව්ලිල්ලට.. ඔහු නිසොල්මන්.. හිත අමුතු බයකින් වෙලා ගනිද්දි වෙව්ලන කටහඬින්...

"අනේ ධීර්... කතා කරන්නකෝ..."

පිලිතුරක් නෑ

"අනේ ධීර්.. රත්තරන්.. අනේ කතා කරන්නකෝ.. මන් මන් ආවා නේ දෙයියනේ.. කතා කරන්නකෝ.."

මෙච්චර වෙලා තාත්ත්විකව වහන් උන්නු ඒ කපටි ඇස් ඔහු විවර කරේ ලස්සන හිනාවක් එක්ක.. කඳුලුත් උනලා ඒ ඇස් වලට

"ඔයා ඇවිද්දු මගේ රත්තරන්.. මන් මන් කිවා නේද ඔයා ඇවිදිනව කියල.. මන් කීවා නේද.. හිනා වේගන වගේම පුළුවන් උපරිම තදින් මාව් වැළඳගෙන හිස් සිඹ සිඹම ඔහු පවසන්නේ එලෙසයි..

"ඔයා මාව හොඳටම බය කරා ධීර්.. "

කියල වට පිට බැලුවේ.. ඈතට මූණු නොපෙනුනාට මෙයාගේම මේ යාලුවො සෙට් එකයි මෙතන මේ ඩ්‍රාමා එක ඇක්ට් කරල් තියෙන්නේ.. ඔවුන් ඔක්කොම සතුටින් හිනා වෙනවා.. හිනා වෙලාම ඔවුන් එතනින් ඉවත් උනේ අපිදෙන්නට තනි වෙන්න දීලයි.. අව්‍යාජ හිනාවක්.. මෙච්චර කාලෙකට ඔහුගෙන් දැකපු ලස්සනම හිනාව..

"තාමත් තාමත් කියනවද මට ආදරේ නෑ කියල මිම්මි.." එක ඇහි බැමක් උස්සලා මටත් නක්කලේටවගේ අහන්නේ එහෙමයි.. ඒ හිත හරි කන්ෆිඩන්ට්.. තවත් මොනවා හංගන්නද ඇස් පනාපිටම ඒක පේද්දි..

"මන් ඔයාට ආදරේ කරන්න ගත්තේ මුලින්ම අපි හම්බුන දවසේ මාව කිඩ්නැප් කරන් උස්සන් ආපු දවස් වල ඉඳන් ධීර්.. එදත් ඔයා මට කොච්චර රිද්දුවත් ඒ රිද්දපු තරමටම මට රිදෙන එක ගැන බය උනා වොරි උනා වගේම රිද්දපු තරමටත් වැඩිය මට හොරෙන් ඔයා රිද්දපු තැන් අත ගගා ඒ ගැන වද උනා.. මට තේරෙන් නෑ ඒ දවස් වල ඒ මොකද කියන්න.. ඒත් ඒ හේතුවම වෙන්න ඇති ඒ දවස් වල ඉඳන් කාටවත් මේ දේ කියන්න මට හිත නොදුන්නේ.. අප්පච්චි ට කියන්න බැරිකමක් තිබ්බේ නෑ.. අයියගේ කේස් එක වගේ ලොකු කේස් එකක් කාටවත්ම හොයාගන්න බැරි තරමට හංගපු අප්පච්චි ට මන් ඔයා ගැන කිව්වා නම් ඔයාට මොනා හරි කරල ඒකත් ඔය වගේම හංගන්න අප්පච්චි ට බැරි කමක් නෑ ධීර්.. ඒ ඔක්කොම දැනගෙනත් මගේ හිත දුන් නෑ ඒ කිසිම දෙයක් අම්මිට අප්පච්චි ට කියන්න.. හේතුවක් කියන්න දන් නෑ ඒත් හිත කිවෙම තනියම දරාගෙන කොහොම හරි ඉදින් කියල ඔයා එක්කම.."

"ඉතින් ඔය මැඩම් තාම් දන් නැද්ද ඔය කියන්න දන් නැති හේතුව මොකක්ද කියල මිම්"

ඔහු හිනා වෙනවා.. සියුම් ලැජ්ජාවක් දැනෙද්දි ඒ පපුවට තුරුල් වේගනම ඇහෙන නෑහෙන ගානට රහසක් කියන්නා වගේ ඔහුගේ කනට කෙඳිරුවේ

"මන් ආදරෙයි ධීර්..."

ඔහුට අහගන්න ඕනි උනු වචන ටික එපමණයි.. ඇසිල්ලකින් ඒ දේතින්ම මගේ මූණ ඇල කරගෙන දෙතොල් වලට නැඹුරු උනේ..

ජීවිතේ පලමු කුළුදුල් හාදුවෙන් ඇස් වලට කඳුලක් උනද්දි.. මිනිත්තුවක් දෙකක් නෑ තුනක්ම ඒ පහස විදගෙන ඔහුගේම එක් ඇඟිල්ලකින් මගේ දෑස් වලට උනපු කඳුලු බිඳුවද පිස දැම්මේ හරි ආදරෙන් වැළඳ ගනිමින්.. හනිකට හිතට ආපු සිතුවිල්ලකට

"ධීර්..."

"ම්ම්ම් වස්තුව.."

"මාව මැරෙයිද..?"

ඒ ඇස් ඒ ශරීරය කේන්තියෙන් රතු වෙන්න ඒ හැටි වෙලාවක් ගියේ නෑ..

"ලෙඩ කියල බලන් නෑ කන කුඩු වෙන්න දෙකක් දෙනව ආයෙම ඔය මූසල කතා කිවොත්.. එදා ඔහොමදෙයක් පොරොන්දු වෙයි කියල මන් හිතුවේ නෑ.. එදත් මේ අද වගේම ආදරේ කරා නම් මන් එවෙලෙම කන කුඩු කරලා.. එදත් ඒ ගැන එතනින් එහාට කතා නොකරේ ඒකයි.. තමුන් පණ්ඩිත කමට හැයි හැයි ගගා කියෙව්වටට.. තමුන් පොරොන්දු උන දේ ඇහෙද්දි මන් එතනින් එහාට එහෙම පොරොන්දුවක් එදා ගත්තේ නෑ.. ඒ හින්ද කට පියන් ඉන්නව ඔය විරිත්තන්න තියෙන දත් ටික මට කියල බඩට ඇර ගන් නැතුව"

ඒ වචනයක් වචනයක් ගානෙ බය උනා කිවොත් හරි.. ඇත්තටම ඔහුට කේන්ති යනවට මන් හරි බයයි. කිසිවක් නොකියා බලන් උන්නේ ඒකයි..

"අම්මෝ අම්මෝ ඉතින්.. ආයෙම එක අතක් උස්සන් නෑ මගේ වස්තුව උඹට මන්.. මාස තුනක් තිස්සේ උබට දුන්නු දුක් වලට හරියන්න තාමත් මන් ඒවා මතක් වෙන මතක් වෙන ගානේ පිච්චෙනව.. " අන්තිම ටික කිවේ උගුරෙන් වගේ...

"ශ්......" කියල ඒ මුවට ඇඟිල්ලක් තිබ්බේ කතාව ඇති කියල යි.. එහෙම්ම හිනාවේගනම මාව ද්‍රේතටම ගත්තේ මන් පුදුමෙන් වගේ බලද්දි..

"මට ඇව්දින්න පුළුවන් නේ දැන්"

"මේ මගේ වහු පැටියෝ.. ඇව්දින්න පුළුවන් කියල එක පාර ඔහොම හොද නෑ මෝඩියේ.. ටික ටික එක්සයිස් එක දෙන්න ඕනි.. අද ඕනෑවටත් වඩා එක්සයිස් උනානේ.. අදට ඒ ටික් ඇති.. පණ්ඩිත වෙන් නැතුව මන් කියන එක කරනවා.."

හිනාවක් දලාම ඒ පපුවට තුරුල් උනේ..

"කෝ ඩිවෝස් පේපර්ස්" කියල අහන ගමන්.. හිනා වෙනවා ඔහු හොදටම..

"තමුසෙට ඔල්මාදේ ඕයි.. මේ මාස ගනන් තිස්සේ ඩිවෝස් පේපර්ස් හදන් ඉන්න මට පිස්සු කියල හිතුවද.. ලෝයර් ට කියල එක දවසින් හදගන්න පුළුවන් එක.. ඒ පේපර්ස් අපේ ඒවා නෙමේ යෝධියේ.. ඔය පොලිසියේ කේස් එකකට මන් චෙක් කරන්න අරන් ආපුවා වගයක් උන් දෙන්නත් අපි දෙන්නා වගේම ඩිවෝස් වෙන්න බෑ යි කිවා.. මන් ඉතින් ගෙදර ගෙනාවා.. නිකම් වටින් ගොඩින් බලල බොරුවට නාහෙන් අඩනවා.. "

කිසිත් නොකියා හිනා වෙලා තුරුල් වෙලා බිලත් පේ කරගෙනම අපි ආවේ වාහනේට.. මාවත් සීට් එකෙන් තියල බෙල්ට් දලා වාහනේ ස්ටාට් කරන ගමන්

"මේ ඉක්මනට යන්.. මන් අලුත් ගෙයක් ගත්තා මිම්ම් අපි ඒ ගෙදර ඉමු හොදද.. මේක මෙහෙ තිබ්බාවේ.. ආයෙම වෙඩින් එකේ වැඩත්

ඔක්කොම ලෑස්ති.. දින ද ගන්න විතරයි තියෙන්නේ.. මත් දන්නව මගේ වස්තුව කොච්චර ආසවෙන් ද උන්නේ කියන්න ලස්සන වෙඩින් එකක් ගන්න.. අපිට දුක් වෙන්න හේතු කොච්චර තිබ්බත්.. මට බෑ ඒ දේවල් හින්දු ආයෙම මැනිකගේ සතුට නැති වෙන්න දෙන්න.. හාද කියන්නකෝ.. මට බබෙක් හදන්නත් ඕනි ඉක්මනට" ඔහු හුරතල් වෙනවා..

ලස්සන හිනාවක් දලා හා කිවේ ඒ ඇස් දිහාම බලාගෙන..

"අපි ඒ ගෙදර ලොකු පිංකමක් කරලම යන් හොඳද.. අයියට වගේම ආදූටත් දෙන්නටම"

ලස්සන හිනාවක් එක්ක හා කියල අපි ඇරඹුවේ අපේ ගමන යන්නයි.. වෙන කොහෙවත් යන්න නෙමේ අපේම ජීවිතයේ අලුත් ගමනක් යන්න...

ඉතින් නවතිමි.....